


💕💕💕 කෙටි කතාවක් 💕💕💕

#ප්‍රථම_පෙමට_නැහැ_මගේ_හිත_බැඳුණේ_අවසන්_පෙම_නුඹ_තමයි_මගේ_මේ_දිවි_ගමනේ

රෑ වැඩත් කරලා උදේට වැඩත් කරනවා කියද්දි ඇඟට හරිම තෙහෙට්යුයි. පහේ වාට්ටුවේ කොහොමත් වැඩ වැඩි. උදේට ඇවිද ගන්න බැහැ දෙපා ඇදුම් කනවා. ඒත් මේක මං ආසාවෙන්ම තෝර ගත්ත රැකියාව. ඔව් මම හෙදියක්. වෛද්‍ය පීඨයට යන්න බැරි නිසා මං හිතුවේ මට ගැළපෙන්නෙම හෙද වෘත්තීය කියලා. මොකද පුංචි කාලෙ ඉඳන්ම මට ඕනි වුණේ මං දුප්පත් වුණත් අසරණ මිනිස්සුන්ට උදව් කරන්න. වෛද්‍යවරයකු රෝගීන්ට නව පණක් දෙන බව ඇත්ත. ඒත් හෙදියෝ රෝගීන්ගේ ජීවනාලිය වගේ. කොච්චර බෙහෙත් කප්පරක් බිව්වත් වැඩක් නැහැ ඒ බෙහෙත බීලා පරිස්සමට හිටියේ නැත්තම්. ඒ හැමදේම හොයලා උපදෙස් දීලා රෝගීන්ගේ පණ කෙන්ද රකින්න හෙදියන්ගේ සහය අවැසිමයි.

උදෙ වරුව සුපුරුදු වැඩ රාජකාරි එක්ක ගෙවිලා ගිහින් දවල් කෑම වරුව ආවා. මං රෑ වැඩ නිසා මට අමාලි මිස්

උදේ වැඩට එද්දී බත් එකක් ගෙනත් තිබ්බා. ඇඟපතේ තෙහෙට්ටුව නිසා මට බඩගිනි වැඩි. මං බත් එක අරගෙන රෝගී ඇඳවල් තීරු දෙක මැද්දෙන් හෙද විවේක කාමරයට එද්දී මගේ ඇස් දෙක නතර වුණේ වියපත් මවක් ළඟ. වාට්ටුවේ ඇතුල් වීම කියලාගහලා තියෙන පුවරුව දිහා ඇසි පිය නොසලමින් බලන් ඉන්න මවක් ළඟ.

" අම්මේ... "

" මිසී.. "

" කවුරු එනකන්ද මේ බලන් ඉන්නේ.. "

" චූටි පුතා බත් එක අරන් එනකන් මිසී.. "

මං පුංචි කාලේ ඉඳන්ම හරිම මානුෂීයයි. මගේ මවත් හෙදියක්. මං ඕලෙවල් කරන කාලේ පිළිකාවක් හැදිලා නැති වුණාට පස්සේ දුක් විඳලා මාව උස් මහත් කරේ මගේ රත්තරන් අප්පච්චී. මේ අම්මා එහෙම කියද්දි මගේ ඇස් වලට කඳුළු ආවා.

" අම්මා මේ බත් එක කන්නකෝ.. පුතා එද්දි පරක්කු වෙයි වගේ.. තව විනාඩි දහයකින් ලෙඩ්ඩු බලන ඉවර වෙනවා.. අම්මා බෙහෙත් ටික බොන්නත් එපැයි.. "

මං අම්මට බත් එක දීලා කියද්දී අම්මා යටහත් පහත් ලෙස හිනා වෙලා මට ස්තුති කරලා කෑම කාමරේ පැත්තට ගියා. මං කුසගින්න යට කරගෙන ආයිමත් වැඩ කරන්න ගත්තා. ටික වෙලාවකින් මං ආයිමත් අර අම්මගේ ඇඳ ගාවට යද්දී තරුණයෙක් මට පිටුපාලා අම්මා එක්ක කතා කරනවා.

" පුතේ.. මේ මිසී මං බඩගින්නේ හිටපු නිසා මිසීගේ බත් පත මට දුන්නා.. ඔය බත් එක මිසීට දෙන්න.. "

අම්මා හිනා වෙලා ඒ තරුණයට කිව්වා.

" මිසීගේ බත් එක රසයි.. ඒත් මගේ පුතාට හොඳට උයන්න බැහැ.. ඒ නිසා බත් එක කොහොමද දන්නේ නැහැ..."

අම්මා හිනා වෙවී කියද්දි අර තරුණයා මගේ අතට බත් එක දෙන්න හදද්දී මං බත් එක කන ගමන් ඒ තරුණයගේ මූණ දිහා බැලුවා. දෙවියනේ විශ්වාස කරන්න පුළුවන්ද ඒ මං අවුරුද්දක් පණ වගේ ආදරේ කරපු ඇස් දෙක. මාව දාලා ගිහිලලත් අායි මාව හොයාගෙන එයි කියලා මං අවුරුදු පහක් බලාගෙන හිටියෙත් එ ඇස් දෙක නිසා.

" පාරමී.. "

මං වගේම ගැස්සුණු ඇස් වලින් මං දිහා බලමින් හිටියේ මගේ ප්‍රථම ප්‍රේමය. මලිඳු.

" අනේ දැකපු කල් එහෙනම් ඔයා දැන් නර්ස් කෙනෙක්..."

මං මොකුත් නොකියාම හිනා වෙලා වාට්ටුවෙන් එළියට ආවා. මගේ මතකය ගියේ අවුරුදු පහකට පෙර අතීතයට.

*************

අවුරුදු හතකට පෙර

මං ඒලෙවල්ස් වලට සත්‍යා එකේ පංති යද්දී තමා මට මලිඳුව හම්බුණේ. මං විද්‍යා විෂය ධාරාව කරාට මලිඳු කරේ වාණිජ විෂය ධාරාව. මලිඳු අපේ පාසලේ ළමයි අතර හරිම ප්‍රසිද්ධයි. මොකද මලිඳු තමා එයාලගේ පාසලේ මාධ්‍ය ඒකකයේ දක්ෂතම නිවේදකයා. මං හොඳම යාළුවා වාණිජ විෂය ධාරාව කරේ. එයා සඳුනි. සඳුනී නිසා මං මලිඳු ගැන දැන ගත්තා. මටත් නොදැනිම ගැණු ළමයි පිස්සුවෙන් වගේ ආදරේ කරන මලිඳුට මාත් හිතින් ආදරේ කරන්න ගත්තා. එකදවසක් මං පංතියට යද්දී කාර්ඩ් එක මාර්ක් කර ගන්න විදියක් නැහැ. කාර්ඩ් එක නැති වෙලා. මගේ රත්තරන් අප්පච්චී දුක් විඳලා හම්බකරපු සල්ලි වලින් මං රුපියල් දාහක් දීලා මීට ටිකකට කලින් ගත්ත කාර්ඩ් එක ගවුමේ සාක්කුවේ හිලෙන් බිමට වැටිලා. මං පංතියට යන දොර ගාවම ඇස් යල කඳුළු පුරවන් බලන් හිටියා.

🔸 ◈ මේ නංගී.. කාර්ඩ් එක අරගෙන නැතිව මෙතන බොරුවට රඟපානවද.. අයිනට යන්න.. තව ළමයි ඉන්නවා..

පිරිමි ළමයි ගොඩක් මං දිහා බලාගෙන ඉද්දී කාර්ඩ් මාක් කරන අයියා මට එහෙම කියද්දී මං ඇස් වල කඳුළු පුරවන් දොර ළඟින් ඈත් වෙලා බිම බලාගෙන හිටියා.

💘💘 පාරමී.. ආ මේ සල්ලි වලින් කාර්ඩ් එක අරන් ක්ලාස් එකට යන්න..

සුදු දිග කලිසමක් ඇඳ ගත්තු තරුණයෙක් මට එහෙම කියද්දි මං බිමට හරවන් හිටපු ඔලුව උඩට හරවලා බැලුවේ ඒ කවුද කියලා බලන්න. ඒ මලිඳු. මං ඇස් වල කඳුළු පුරවන් ඒ ඇස් දිහා බැලුවා.

💘💘 අඬන්න එපා... කොල්ලොත් බලාගෙන ඉන්නවා.. ඔයා සඳුනිගේ යාළුවනේ.. දැන් ඉතින් යන්න ක්ලාස් එකට මේ සල්ලිත් අරන්.. සර්ත් ඇවිත්..

මලිඳු මගේ අතට රුපියල් දාහ දීලා කිව්වා. අප්පච්චී ඇරෙන්න මට කිසිම පිරිමියෙක් සතයක්වත් දීලා නැහැ. ඒ නිසා ඒ වෙලාවේ අසරණ වෙලා හිටපු මට උදව් කරපු මලිඳු ගැන මගේ හිතේ තිබ්බ ගෞරවය තවත් වැඩි වුණා.

***************

මාස තුනකට පසු.

දන්නෙම නැතිව මමයි මලිඳු ආදරේ කරන්න පටන් ගත්තා.

💘💘 ගුඩ් මොර්නින් සුදූ..
💘💘 ගුඩ් මෝර්නින් මලී..
💘💘 අද රිස්ලාට්ස් එනවානේ.. මට නම් බයයි මලිඳූ..
💘💘 බය වෙන්න එපා.. ඔයා හොඳට පාස්.. මේ රිසාල්ට්ස් ආවට පස්සේවත් කොහේහරි යමු.. පාළුයි...
💘💘හරි මලිඳූ..

***************

💘💘 මලිඳූ.. මට බී තුනයි.. මෙඩිසින් යන්න නම් බැහැ..
💘💘 මට සී තුනයි සුදූ.. ඒකට කමක් නැහැ.. අපි ජොබ් එකක් කරමු.. මගේ කෙල්ලට මොනාද ඕනි..
💘💘 ඒක මං මැරි කරාට පස්සේ ඉල්ලන්නම්..
💘💘 හී හී.. මොනාද අනේ ඒ.. ඉල්ලන්නකෝ..
💘💘 අනේ මට ලැජ්ජයි..

💘💘 යකෝ තව ටික කාලෙකින් මං මිනිහනේ.. මට කියපන්කෝ වස්තුවේ...
💘💘 මට ලස්සන දූවලා දෙන්නෙක් ඕනි..

මං එහෙම කිව්වම මලිඳු හයියෙන් හිනා වුණා.

💘💘 මෙයා හිතෙලා තියෙන දුර.. දැන් වුණත් දෙන්න බැරිකමක් නැහැ..
💘💘 අනේ යන්න මලිඳු මට ලැජ්ජයි...

***************

අවුරුද්දකට පසු..

💘💘 මලිඳු..
💘💘 කියන්න..
💘💘 ඇයි මේ තරහින්..
💘💘 තරහා යන්නේ නැද්ද කියනවා.. මං විතරක් ෆෝන් එකෙන් ලව් කරනවා.. මගේ යාළුවෝ ඔක්කොම කෙල්ලෝ‍ ඒ එක්ක බීච්, පාර්ක්, ෆල්මිස් වලට, රෑම් යනවා.. මං නිකන් නිකමෙක් වගේ ඉන්නවා.. තමුසෙත් ෆෝන් එකෙන් හුරතල් වෙනවා..
💘💘 ඉක්මණටම මැරි කරමු මලිඳු..
💘💘 මැරි කරන්න ඕනිද හැමදේකටම.. යන්නම් මාසයක් කෑ ගැහුවම එක දවසක් හම්බවෙන්න එනවා.. එදාටත් නීති කෝටියයි.. අල්ලන්න එපා.. උම්මාහ් එපා...ළඟට එන්න එපා.. කවුරුහරි දකී.. මහ ලෝකු පතිවෘත්තාව..
💘💘 ඇයි මේ රත්තරන්..
💘💘 රත්තරන්.. බල්ලට දානවා තමුසෙගේ ඔය ආදරේ.. මං එපා කියද්දි නර්සින් ගියා.. දැන් ඒකට යන්න ඕනි නිසා බෝර්ඩ් වෙලා.. මාව හම්බවෙන්න එන්න නැහැ.. ෂිට්.. මාත් මනුස්සයෙක්.. මටත් ආසවල් තියෙනවා.. සඳුනී හොඳයි තමුසෙට වඩා..

මලිඳු එහෙම කියද්දී මගේ පපුව පිච්චිලා ගියා.

💘💘 සඳුනී..
💘💘 ඔව් තමුසේ මැරිච්ච අම්මෙක් බඳාගෙන නර්සින් යන්න දඟලද්දි මං සඳුනීට ලං වුණා.. ඒකි මට දීපු සැපක්.. ෂිට් මට තමුසෙව අල්ල ගන්න බැරි වුනාණේ..

මලිඳු එහෙම කියද්දි මගේ පපුව පිච්චිලා ගියා. ඒ කියන්නේ මලිඳු මාත් එක්ක වගේම සඳුනී එක්කත් යාළු වෙලා. සඳුනීගේ මුළු ජීවිතේම විනාශ කරලා.මං මගේ අවුරුද්දක කුළුදුල් ආදරේ අමතක කර ගන්න බැරිව ගොඩක් ඇඬුවා. අඬලා අන්තිමට හිත හදාගන්න අවුරුදු හතරක් ගියා.

***

💔💔 පාරමී..

මං හැරිලා බැලුවේ මං ගාවට ඇවිත් කතා කරන මලිඳුගේ කටහඬට.

💔💔 ඔව්.. කියන්න මලිඳු..

💔💔 පිංසිද්ධ වෙනවා.. අම්මව බලා ගත්තට..
💔💔 ඒක මගේ රස්සාව මලිඳු..
💔💔 මාත් එක්ක තරහෙන්ද පාරමී ඔයා..
💔💔 අනේ නැහැ මලිඳු.. මං ඒ අතීතේ අමතක කරලා දැන් ඉන්නේ.. සඳුනීට කොහොමද..
💔💔 මං ඔයාට වගේම සඳුනීට කරෙත් බොරුවක්.. සඳුනී ඇත්ත දැන ගෙන ඔයා වගේම යාළුවට ද්‍රෝහි වුණා කියලා මාව දාලා ගියා.. අඳුරන අයියා කෙනෙක් මැරි කරලා රට ගියා..
💔 හ්ම්ම්..
💔 අනේ මං දැන් ගොඩක් හැඳිලා ඉන්නේ පාරමී.. මං තාමත් ඔයාට ආදරෙයි.. මං ළඟට එන්න..

මලිඳු ඇස් වල කඳුළු පුරවන් කිව්වා.

💔 මං අවුරුදු හතරක් ඔයා එනකන් බලන් හිටියා.. ඒත් ඔයා මාවයි සඳුනීයි දෙන්නම අතෑරලා වෙන කෙල්ලෝ පස්සේ ගියා ඔයා අර කියපු රාගික සතුට හොයාගෙන.. දැන් ඔයාට ඒක හම්බුණාද මලිඳු..
💔 මට සමාවෙන්න පාරමී.. අනේ මං ළඟට එන්න..

මලිඳු අඬ අඬ කියද්දී එක පාරටම මං හැරිලා බැලුවේ මගේ උරහිසට දැනුණු ස්පර්ශයට.

🖤 අම්මී.. ඔන්න දූලා දෙන්නට අම්මී ඕන කියලා අඬන්න ගත්තා.. ඒ නිසා මං එක්කන් ආවා..

◈ ආහ්.. ඩොක්ටර් ආකාෂ් බබාලා දෙන්නත් අරන් හොස්පිට්ල් ආවේ ඇයි..
◈ මේ දෙන්නා අම්මා ඉල්ලලා අඬනවා අමාලි මිස්.. ඊයේ රෑ පාරමී නයිට්නේ..
◈ ඔව් ඉතින් දූවලා දෙන්නට පාළු ඇති.. අම්මයි තාත්තයි දෙන්නම මාරුවෙන් මාරුවට හොස්පිට්ල්නේ..

ඔව් මම දැන් අම්මා කෙනෙක්. පුංචි නිවුන් සුරංගනාවියන් දෙන්නෙක්ගේ අම්මා කෙනෙක්. හොස්පිට්ල් එකේ වැඩ කරන වී ඕ ජී ඩොක්ටර් ආකාෂ්ගේ වයිෆ්. මට දැන් ආදරණීය සැමියෙක් ඉන්නවා. මගේ අවධානේ බිඳුණේ අවුරුද්දක් වයස දූවලා දෙන්නා අම්මා කියලා කෑ ගහද්දි. ආකාෂ් දෙන්නා දෙපැත්තට අත් දෙකට වඩාගෙන වෙනදා තරම්ම ආදරෙන් මං දිහා බලා ගෙන ඉන්නවා.

🖤 රත්තරනේ.. අම්මගේ ඇගේ පරාව.. තව ටිකකින් ගෙදර ගිහින් කිරි දෙන්නම්.. තාත්තා ළඟම ඉන්නකෝ..

මං දූවලා දෙන්නගේ පුංචි අත් දෙක සිප ගෙන කිව්වා.

🖤 මහත්තයෝ..
🖤 සුදූ නෝනා..
🖤 මේ මලිඳු.. මං මහත්තයට කිව්වේ..
🖤 මට මතකයි සුදූ නෝනා..

ආකාෂ් මලිඳු ගාවට ගිහින් අතට අත දුන්නා.

◈ මං ආකාෂ්.. පාරමීගේ හස්බන්ඩ්.. ප්‍රින්සස්ලා අන්කල්ට කතා කරන්න..

ආකාෂ් එහෙම කියද්දී දූවලා දෙන්නා හිනා වෙලා මලිඳු දිහා බැලුවා. මලිඳු ඇස් වල කඳුළු බිමට වැටෙද්දීම දූවලා දෙන්නගේ දෙපා සිපා ගත්තා.

🖤 සුදු නෝනා.. මං කාර් එකේ ඉන්නම්.. ඔයා කතා කරලා එන්නකෝ..

ආකාෂ් හිනා වෙලා දුවලා දෙන්නත් අරන් ගියා. මලිඳු අඩ අඩ මගේ ළඟට ආවා.

💔 පාරමී.. ඔයා දුවලා දෙන්නෙක්ගේ අම්මා කෙනෙක්ද... අපි මැරි කරා නම් ඒ මගේ පැටව් දෙන්නා නේද..

මලිඳු මගේ අත් දෙක අල්ලගෙන හොඳටම ඇඩුවා.

💔 දැන් අඬලා වැඩක් නැහැ මලිඳු.. ගිය දේවල් ගියා.. දැන්වත් ඔයා හැදලා හොඳ සැමියෙක් තාත්තෙක් වෙන්න.. ඔයාට වඩා මට පණ වගේ ආදරේ කරන රත්තරන් මහත්තයෙක් මට හම්බුණා.. දැන්වත් කෙල්ලන්ගේ ජීවිත එක්ක සෙල්ලම් නොකර ඉන්න.. ආදරෙයි කියලා බොරු බලාපොරොත්තු දීලා රවට්ටන්න එපා...

මං මලිඳුට සමු දීලා ඉස්සරහා නතර කරලා තියෙන කාර් එක පැත්තට ආවා. මං හැරිලා බලද්දී මලිඳු බිත්තියට ඔළුව ගගහා හොඳටම අඩනවා. ඔව් මලිඳු ඔයාට දුක ඇති මාව රවට්ටන්න ගිහින් අන්තිමට රැවටුණේ ඔයා. මං ආපහු හැරිලා කාර් එකට නැඟලා ආකාෂ්ට තුරුල් වෙලා ඒ පපුව සිප ගත්තා.
🖤#ප්‍රථම_පෙමට_මගේ_හිත_බැඳුනේ_නැහැ_මහත්තයා_තමා_මගේ_ජීවිතේ_මං_මැරෙනකන්ම

මං ආකාෂ්ට තුරුල් වෙලා කිව්වා.

🖤 මං දන්නවා සුදු නෝනා.. ඔයාලා තුන්දෙනා මගේ පණ..

ආකාෂ් මගේ නළලත සිපගෙන දුවලා දෙන්නා පපුවට තුරුල් කරගෙන කිව්වා.

උදාරි ප්‍රේමරත්න.. 😇

🔥 සිතන්නට යමක්...
☞ ප්‍රථම පෙමම අවසන් පෙම විය යුතුද..
☞ ප්‍රථම පෙම නැති වුණු පසු කොච්චියට ගෙල තබා, වස පානය කර දිවි තොර කර ගත යුතුමද..
☞ අසීරු සොදුරු අතීත මතකය සෙමින් අමතක කොට නැවත ආදරය කර නොහැකිද...

💥 සිතන්න...
☞ අද සමාජයේ අසරණ පාරමී වගේ ආදරන්වන්තියන් කීයක් ඇද්ද.. එයින් ජීවිතය තොර කර ගෙන නොමැතිව ජීවිතය සාර්ථක කරගත් පාරමීලා කීයක් ඇද්ද..
☞ සල්ලාලකම නිසා ගැළපෙන ආදරය සොයා ගත නොහැකි මලිඳුලා කීයක් ඇද්ද..
☞ ආකාෂ් වැනි රත්තරන් ස්වාමිපුරුෂයන් කීයක් ඇද්ද..

🔥🔥🔥 වඩා වැදගත් වන්නේ ප්‍රථම පෙම නොව සැබෑ ආදරයයි.. වඩා වැදගත් වන්නේ සැබෑ ආදරය තම අවසන් ආදරය කර ගැනීමයි.... 🔥🔥🔥

☞ වෙනත් කෙටි කතා....

🖤ප්‍රථම පෙම නුඹ තමයි සැමදා...

https://m.facebook.com/story.php?story_fbid=298346483971975&id=100013898779829

**❤️ නුඹ මගේ ලේ මගේ පුතුනි...**

https://m.facebook.com/story.php?story_fbid=298929357247021&id=100013898779829

**❤️ රකුසෙකුය බියකරු ඔබයි ඇයගේ මිනිමැරු...**

https://m.facebook.com/story.php?story_fbid=300495827090374&id=100013898779829

**❤️ ලේ කිරි සුවඳ නැති දා මං වද වූවා...**

https://m.facebook.com/story.php?story_fbid=301173493689274&id=100013898779829


ලේ කිරි සුවඳ නැතිදා මං වඳ වූවා...
adityacreations
උදාරි ප්‍රේමරත්න

💕💔💕💔💕💔💕💔 කෙටි කතාවක්... 💕💔💕💔💕💔💕💔

🔴⚫ ඔය වඳ පිදිච්ච ගස් ටික ඔක්කොම කපලා දාපන් සුමනා.. මුළු බංගලාවම මූසල පාටයි.. කොහෙද ඉතින් ගෙදර මහ එකී වඳ වුණාම වත්තේ මල් පැලේකවත් මලක් එයිද.. අවුරුදු හතක් ගිහිල්ලත් දරුවෙක් වදන්න බැරි නම් ඉතින්.. අනේ හපොයි.. මේවා බලන්න මාත් ඉන්නවනේ...

වෙනදා වගේම තිසරුගේ අම්මා මට උදේ පාන්දරම දෙස් දෙවොල් තියන්න පටන් ගත්තේ උඩු මහලේ ඉන්න මාව වත්ත පහළදී දැකපු නිසා වෙන්නැති. මගේ පපුව පිච්චිලා ගියා. මං වෙනදා වගේම ඇස් වල කඳුළු පුරවන් නිදන කාමරේට ගියා.

💘💘 තිසරු.. ඔයා අද කලින් එනවනේ.. අපි බෙහෙත් ගන්න යමු..
💘💘 මෙත්මා.. තව මොන බෙහෙත්ද.. අවුරුදු පහක් තිස්සෙම බෙහෙත් බිව්වා කියලා වැඩක් වුණාද.. නැහැනේ.. මට පාඩුවේ වද නොදී ඉන්නවා.. රස්සාවට යන්න දෙන්නෙත් නැහැ උදේ පාන්දරම කෑ ගහනවා..
💘💘 ඇයි මහත්තයෝ ඔයත් මට බයින්නේ.. මාව දැන් එපා වෙලාද.. අපි අද යන්නේ ඔයාට බෙහෙත් ගන්න..
💘💘මොන විකාරයක්ද.. මට බෙහෙත් ගන්න මං වඳ මිනිහෙක්ද.. අපේ පවුලේ හැමෝටම ළමයි ඉන්නවා.. කොච්චර අවුරුදු ගාණක් ආදරේ කරලා කසාඳ බැන්දත් වැඩක් නැහැ ඒ ආදරේ රැක ගන්න නම් දරුවෙක් ඕනි..

තිසරු මටත් බැනලා තරහෙන් ගියා. මං තිසරු යන දිහා උඩු මහලේ ඉඳන් බලන් හිටියා. අනේ දෙවියනේ ඇයි මටම මේ වගේ නස්පැත්තියක් වුණේ. තිසරුගේ ඇස්, ඒ තොල්, ඒ මූණ තියෙන පැටියෙක් මගේ බඩට එන්නැති හැටි කියලා මං කුස අල්ලගෙන හීල්ලුවා. සල්ලි කප්පරක් තිබ්බත් වැඩක් නැහැ දරු සෙනහස නැත්තම්. මං කඳුළු පිහිදාගෙන කාමරේට ආවා. මං බැලුවේ මට ආපු කෝල් එකට.

📲📱 ලොකු අක්කේ.. අද එනවා නෙ‍ද.. මං චැනල් එක දැම්මා ස්පෙෂලිස්ට් සර්ජන්ට් කෙනෙක්ටම.. අයියව පෙන්නමු..
📲📱 වැඩක් නැහැ නංගී.. තිසරු කැමති නැහැ.. අපි අතෑරලා දාමු ඕක..
📲📱 එහෙම කියලා පුළුවන්ද.. අක්කා දන්නවනේ තිසරු අයියගේ අම්මගේ කටේ සද්දේ.. ඔයාට වඳ ගෑණි කියලම බයිනවා.. ඔයා කොහොමද මේවා ඉවසන්නේ..
📲📱 තිසරු කියන්නේ මගේ පණ ටික.. මං ඉවසනවා..
📲📱 කවදාහරි අයියටත් අක්කව එපා වුණොත්..
📲📱 මොනදේ වුණත් තිසරු මට ආදරෙයි.. එයාට මාව එපා වුණොත් මං මැරිලා යනවා..
📲📱 හ්ම්ම්.. අනේ මන්දා අක්කේ..

*************************************

එදින රාත්‍රියේ.

මං අද තිසරු කැමතිම කෑම හදලා මේසෙට ඇරියා. අම්මයි තිසරුයි ඇවිත් කෑම මෙ‍ේසෙ‍ේ වාඩි වෙලා කෑම බෙදා ගත්තා.

🔴⚫ පුතා..
🔴⚫ අම්මේ..
🔴⚫ මාත් ආසයි මැරෙන්න කලින් දරුවෙක් බලන්න.. අපි එපා කියද්දී ආදරෙයි කියලා කර ගහ ගත්තා.. ඒක කමක් නැහැ කියමු.. ඒත් වඳ ගෑණියෙක්.. දැන් අවුරුදු හතක්ම බැලුවනේ.. දැන් කරන්න තියෙන්නේ මේ කසාදේ

කටු ගාලා දාලා වෙන කෙල්ලෙක් බඳින එක..

තිසරුගේ අම්මා එහෙම කියද්දී මං කෑම මේසෙන් නැගිට්ටා නෙමෙයි නැඟිටුණා. මං මොකුත් නොකියම හැඩූ කඳුලින්ම නිදන කාමරේට දුවගෙන ඇවිත් ඇඳට වැටුණා. දන්නෙම නැතිව ගොඩක් වෙලාම අඩ අඩ ඉඳලා මට නින්ද ගිහින්. මං ඇහැරුනේ මගේ කුසට දැනුණු සීතල ස්පර්ශයට.

💘💘 මෙත්මා..
💘💘 අනේ මගේ මහත්තයෝ..

මං තිසරුගේ රළු පිරිමි පපුවට තුරුල් වෙලා ගොඩක් වෙලා ඇඬුවා. තිසරු මාව තුරුල් කරගෙන මගේ පිට පිරිමැද්දා.

💘💘 අම්මා කියන ඒවා ගණන් ගන්න එපා මෙත්මා..
💘💘 මං දැන් අවුරුදු පහක්ම ඉවසනවා මහත්තයෝ.. අම්මා බැන්නට කමක් නැහැ.. මහත්තයත් මාව මඟ අරිද්දි මට දරා ගන්න බැහැ..
💘💘 හිතලා කරන්නේ නැහැ මෙත්මා.. ඒත් මට දරු පැටියෙක් ඕනි..
💘💘 අපි දරුවෙක් අරන් හදාගමු..

මං එහෙම කිව්වම තිසරු විදුලියක් වැදුණා වගේ නැගිට්ටා. මගේ කොණ්ඩෙන් අල්ල ගත්තා.

💘💘 උඹට පිස්සුද.. මායාදුන්න පරම්පරාවේ ලේ නැති එකෙක්ට මේ බූදලේ දෙන්න.. ඊට වඩා හොඳයි..
💘💘 මොකද්ද මහත්තයෝ...

මං ඇස් වල කඳුළු පුරවන් ඇහුවා.

💘💘 වෙන ගෑණියෙක්ව බැඳලා ළමයෙක්ව හදා ගන්නවා..

තිසරු අහක බලාගෙන කියද්දී මගේ පපුව පිච්චිලා ගියා. මං ඇඳෙන් නැගිටලා තිසරුගේ දෙපා ළඟ වැඳ වැටුණා.

💘💘 අනේ මගේ රත්තරනේ.. මාව අතාරින්න එපා.. මාව මැරිලා යයි.. මං කියනවට අපි බෙහෙත් ගන්න යමු.. මහත්තයත් බෙහෙත් ගමු.. තව අවුරුද්දක් බලමු..
💘💘 හැමදාම ඕක කියන්නේ.. මට දැන් මේ ජීවිතේ තිත්ත වෙලා.. මං බෙහෙත් ගන්න මං වඳ එකෙක්ද කියපන් ගෑණියේ..

තිසරු වියරුවෙන් වගේ මගේ කොණ්ඩෙන් අල්ලන් කෑ ගහලා මාව තල්ලු කරපු පාරට මාව ඇඳ විට්ටමේ වැදිලා නළල ගල් වුණා. තිසරු දොර හයියෙන් වහගෙන තරහෙන් පුපුරමින් කාමරෙන් එළියට ගියා.

**********************************

සතියකට පසු..

අම්මගේ බැනුම් එන්න එන්න වැඩි වුණා. තිසරුට බල කරා පවිත්‍රා කසාද බඳින්න කියලා. තිසරු කියන්නෙත් මනුස්සයෙක්. අම්මගෙයි මගෙයි වචන වලට මැදි වෙලා එක තැනක ඉඳන් තනියම දුක් විඳිනවා. කවදාවත් නැතිව තිසරු බොන්න ගත්තා. මං තිසරුව දන්නේ දැන් අවුරුදු දහයක ඉඳන් තිසරු මට පණ වගේ ආදරෙන් හිටියේ.

දරුවෙක් නැති හින්දද මන්දා තිසරු දැන් මට ආදරේ නැහැ. තිසරුට මාව එපා වෙලා. පපුව පැලෙන්න තරම් වේ්දනාවක් ආවා. තිසරු කොහොමත් මේ පාර අම්මා කියන දේ අහයි. මොකද අම්මගේ අකමැත්තෙන් මාව කසාඳ බැඳපු නිසා තමා දැන් මෙහෙම දෙයක් වුණේ කියලා තිසරුගේ හිත කියනවා ඇති. තිසරු එදා ගෙදරින් ගියාට පස්සේ තාම ගෙදර ආවේ නැහැ. ඒ මං නිසානේ. තිසරුට පවිත්‍රාව බඳින්න තියෙන එකම බාධාව මං වෙන්නැති කියලා මට හිතිලා මං තිසරුට කෝල් කරා.

💘💘 මහත්තයෝ.. ඇයි ගෙදර එන්නේ නැත්තේ..
💘💘 මොන ගෙදරද.. මගේ මුළු ජීවිතේම කාලකණ්ණි වුණා.. මං මැරිලවත් යන්නම්..
💘💘 එපා මහත්තයෝ.. ඔයා මගේ මුළු ජීවිතේම.. ඔයා ජීවත් වෙන්න.. මං මැරිලා යන්නම්..

මං අඬ අඬම කිව්වා.

💘💘 ඔව් ඔව්.. දෙන්නගෙන් එක්කෙනෙක් මැරුණම හරි.. වද නොදී ෆෝන් එක තියනවා මට වැඩ තියෙනවා...

තිසරු එහෙම කියලා කෝල් එක කට් කරා. මං අඬ අඬම කල්පනා කරේ මීට අවුරුදු හයකට කලින් තිසරු මං කෝල් කරාම කතා කරපු විදිය.

💘💘 මහත්තයෝ..
💘💘 කියන්න මැණික.. දැන්ද මාව මතක් වුණේ..
💘 අනේ මහත්තයෝ.. මං මේ ගාර්ඩ්න් එකේ මල් වලට වතුර දැම්මා..
💘 මාත් එක්ක දැන් කතා කරන්නෙත් මලක් තමා.. ආදරෙයි මැණික ගොඩක් උම්මාහ්..
💘 මාත් ආදරෙයි මහත්තයෝ.. කෝ දැන් වැඩ කරන්න.. මං තියන්නම්..
💘 ඔහොම ඉන්න.. මට වැඩ නැහැ.. මගේ කම්පැනි එක.. මං සී ඕ.. වැඩ නැහැ.. කෝ උම්මාහ් එකක් දෙන්න..

මට පරණ අතීතයයි දැන් වෙනසයි මතක් වුණා. ඔව් ඒ කියන්නේ අම්මට වගේම තිසරුටත් මාව එපා වෙලා. මං තවත් ඉන්න එකෙන් වෙන්නේ තිසරුගේ සැනසීම නැති වෙන එක. මං ඒ නිසා පොඩි ලියුමක් ලියලා තියලා තිසරු මට අරන් දීපු කන කර ආභරණ ගලවලා සුදු ඇඳුමක් ඇඳගෙන සාලෙට ආවා.

⚫ අම්මේ.. මං පන්සල් ගිහින් එන්නම්..

මං අම්මගේ දෙපා සිප ගෙන දෙපා වැන්දා.

⚫ නාවට කමක් නැහැ..

අම්මා එහෙම කියලා මං ගෙයින් එළියට ආපු ගමන් හයියෙන් දොර වැහුවා. මං ජේන දුරින් තියෙන කළුතර බෝධියට පයින්ම ආවා. කළුතර බෝධියට අම්මයි තාත්තයි එක්ක ඇවිත් ඉන්න හුරතල් දරු පැටව් දැක්කම මගේ ඇස් වල කඳුළු අළුත් වුණා. මං හිතේ හැටියට බුදුන් වැඳලා මගේ රත්තරන් මහත්තයා තිසරුට කරදරයක් වෙන්න එපා කියලා ප්‍රාර්ථනා කරලා කළුතර පාලම ගාවට ඇවිත් කළු ගග දිහා බලාගෙන කල්පනා කරා. කළු ගඟේ වතුර අද හරිම නිසලයි. ගලා යන වතුර ධාරාව හරිම තැන්පත්. ඒත් මේ හැම තැනකම ලොකු දුකක් සැඟවිලා තියෙනවා. හරියට මගේ හිතේ වගේ.#ලේ_කිරි_කඳුලක්_නැතිව_මං_වඳ_ගෑණියෙක් කියලා හංවඩු ගහපු සමාජය ගැන මට තියෙන්නේ දුකක් වගේම කලකිරීමක්. කළු ගඟේ වතුර තරමටම මං මේ අවුරුදු හත පුරාවට දරුවෙක් නැතිව අඬන්න ඇති. මගේ මතකෙට ආවේ මං ගෙදර ලියලා තියලා ආපු ලියුම.

ආදරණීය තිසරු,

මං ඔයාව දැනගෙන දැන් අවුරුදු දහයක් මහත්තයෝ. අම්මා තාත්තා නැති මං ඔයාට ආදරේ කරේ මගේ පණ වගේ. ඒත් දරුවෙක් නැති නිසා ඔයාට මාව එපා වුණා. දරුවෙක් අපිට නැත්තේ මගේ වරදින් නෙමෙයි රත්තරන්. ඒක ඔයාගේ අඩුපාඩුවක්. ඒකයි මං ඔයාට බෙහෙත් ගන්න යමු කිව්වේ. ඔයා ඒකට බැහැ කිව්වම මං ඒකයි කිව්වේ එහෙනම් දරුවෙක් අරන් හදා ගමු කියලා. ඒත් ඔයාට ඒ හැමදේටම වඩා ඔයගේ පරම්පරාව ලොකු වුණා. අඩුපාඩුවක් නැති වුණත් මං වඳ ගෑණියෙක් කියලා මුළු ලෝකෙම කෑ ගහද්දි මං අවුරුදු හතක් ඉවසුවා. ඒත් මහත්තයා මට වඳ ගෑණියෙක් , මැරිලා පලයන් කිව්වම මට තවත් ඉවසන්න බැහැ. මහත්තයට මතකද බඳින්න කලින් මහත්තයට වුණ ඇක්සිඩන්ට් එක. එදා තමා මේ හැමදේම වෙලා මහත්තයට දරුවවෙක් හදන්න බැහැ කියලා ඩොක්ටර් කිව්වේ. මං කසාඳ බඳින්න කලින් ඉඳන්ම දන්නවා මහත්තයට දරුවෙක් හදන්න බැහැ කියලා. ඒත් ආදරේ නිසාමයි මං මහත්තයගේ ඒ අඩුපාඩුව අමතක කරලා කසාඳ බැන්දේ. හැමදාම එක වගේ ආදරේ කරා. ඒත් මහත්තයටත් මං අන්තිමට වඳ ගෑණියෙක් වුණා. මේ වඳ ගෑණි මහත්තයා මේ ලියුම කියවද්දිත් මැරිලා. මහත්තයා සතුටින් ඉන්න.. මං හැමදාම ආදරෙයි.. මහත්තයා ලබන ආත්මෙදිත් මගේම වෙන්න.. බුදුසරණයි..
ආදරණීය,
මෙත්මා.

ලියුමේ ලියලා තිබ්බ හැම වචනයක්ම හිතේ දෝංකාර දෙද්දි මං කළුතර බෝධියේ කොත් කැරැල්ල දිහා බලලා වැඳලා මගේ මහත්තයා සතුටින් ඉන්න කියන ප්‍රාර්ථනාව හිතේ තියගෙනම කළු ගඟේ ගැඹුරු පතුලටම ගිලී ගියේ සතුටින්. මහත්තයගේ සතුටම ප්‍රාර්ථනා කරමින්.

- නිමි -

ලේ කිරි කඳුළු අවැසිය අපේ ආලයට
දරුපෙම බැඳ තබයි අපේ ජීවිත කුලගෙයට
හැදූ මව නැතිව වැදූ මව අගයන ලෝකයට
හැදූ මව වඳ වුණේ ඇයි මේ අකාලෙට

උදාරි ප්‍රේමරත්න 🙂

*****************************************
පසුවදන
🔥 අද සමාජයේ මෙත්මලා, යසිරුලා කීයක් නම් ඇත්ද..
🔥 දරු සුරතල් බැලීමට වැදූ මවක්ම විය යුතුද..
🔥 හැදූ මවට මේ සමාජයේ තැනක් නැතිද..

🔥🔥🔥 වරද කාගෙද
● තම ස්වාමියාට පණ වගේ ආදරේ කර ඔහුගේ අඩුපාඩු සඟවමින් ඔහු සමඟම සිටි ආදරණීය බිරිඳ මෙත්මගෙද...
● සැමියාගේ අඩුපාඩු සඟවමින් ජීවත් වන , වඳ ගෑණියෙක් යන අපවාදය ඉවසමින් සිටි අ◌ාදරණීය බිරිඳට පහර දුන් තිසරුගෙද...
● මුණුබුරෙක් බැලීම තම එක අරමුණ කරගෙන කරගෙන ජීවත් වන තිසරුගේ වියපත් මවගේද...

🔥🔥🔥 සිතන්නට යමක්...




💕💘💕💘💕💘💕💘 කෙටි කතාවක්... 💕💘💕💘💕💘💕💘

💘💞මහත්තයෝ..

💘💞මගේ සුදූ මොකද කරන්නේ..

💘💞කාත් කවුරුත් නැති මං මොකක් කරන්නද මහත්තයෝ.. මහත්තයා එනකන් ලතා අම්මා එක්ක ඉන්නවා..

💘❤සුදු ගොඩක් බිසී මේ දවස් වල.. හොස්පිට්ල් යනවා.. එනවා.. ඔයාට කෝල් කරනවා තමා.. තව සති දෙකකින් මං ලංකාවට එනවනේ..
💘❤මේ පාර නම් මාව දාලා රට යන්න බැහැ..මහත්තයා මෙහේ හොස්පිට්ල් එකක වැඩ කරන්න.. අනික මට බැහැ ඕස්ට්‍රේලියා යන්න..
💘❤හ්ම්ම්.. හරි එහෙනම් ලංකාවෙම ඉමුකෝ...
💘❤මහත්තයා වී ඕ ජී කෙනෙක්නේ.. ඉතින් මෙහෙ අපි චැනල් සෙන්ටර් එකක් දා ගමු.. එතකොට හොස්පිට්ල් යන්න ඕනිත් නැහැනේ.. මං ළඟම ඉන්න පුළුවන්..
💘❤හරි මගේ ආච්චි අම්මේ.. තව සති තුනකින් ඔයා මගෙනේ.. ඊට පස්සේ මං ඔයා ළඟින් හෙලවෙන්නේ නැහැ..
💘❤ආදරෙයි මහ ගොඩක් මගේ දොස්තර මහත්තයට..
💘❤මාත් ආදරෙයි මගේ මැණිකට..
💘❤අයියේ.. වලව්වේ කැළෑව වැවිලා කවුරුහරි දම්මලා සුද්ද කරන්නද..
💘❤පිස්සුද මන්දාකිණි ඔයාට.. තනි පංගලමේ ඔයා ඉන්නේ.. වලව්වට කවුරුත් ගෙන්න ගන්න එපා.. ඔයා අපේ ගෙදර යන්න.. මං අම්මට කියන්නම්..
💘❤ඒත් අයියේ.. ලතා අම්මා පව්නේ.. මහත්තයෝ තව සති තුනයිනේ.. ඉවසමු..
💘❤හරි සුදූ.. මං එහෙනම් තියන්නම්..බුදුසරණයි...

අම්මයි තාත්තයි නැති වුණාට පස්සේ මගේ මුළු ජීවිතේම වුණේ සිහින අයියා. නිකන් සිහින නෙමෙයි. ඩොක්ටර් සිහින. අහම්බෙන් අපි හම්බුණේ හොස්පිට්ල් එකේදීමයි. ඒක ආදරයකට පෙරළුණා. මං රස්සාවක් කරනවට අයියා අකමැති නිසා මං බැංකුවෙන් අයින් වෙලා අපේ පරණ වලව්වේ හිටියා. තව සති තුනකින් අයියගෙයි මගේ වෙඩින් එක. මං මනමාලියක් වෙන දවසට බලන්න අම්මයි තාත්තයි නැහැ කියලා හිතෙද්දී මට හොඳටම ඇඬුනා. හැමදාම වගේ මගේ හිත හැදුවේ ලතා අම්මා තමා.

*********************

සති දෙකකට පසු..

💘❤මහත්තයෝ.. කොහෙද ඉන්නේ.. මං එයාර්පෝර්ට් එකට ආවා..

ඒත් එක්කම මං ළඟට ඇවිත් තුරුල් කරගත්තේ සිහින අයියා. එයා තමා මගේ මුළු ජීවිතේම.

💘❤මගේ කෙල්ල හැඩ වෙලා.. තව සතියකින් මගෙනේ..

අයියා මගේ ඉන මිරිකලා කියද්දී මට ලැජ්ජත් හිතුණා.

************************
දින දෙකකට පසු..

💘❤සුදු කියන්නකෝ් මේ සාරි එක හොඳයිද..
💘❤ඔව් ලස්සනයි.. මහත්තයෝ හනිමූන් යන්නේ කොහෙද..
💘❤මේකිට තියෙන හදිස්සිය.. චුට්ටක් හිටුකෝ.. මැරි කරලා සතියක් ලංකාවේ ඉඳලා අපි බැංකොක් යමු.. මොකද මට මේ බඩට ඉක්මණටම පැටියෙක් ඕනි.. මගේ මන්දාකිණි වගේ තවත් ලස්සන මන්දාකිණියක්..

අයියා මගේ කුස අල්ලලා කියද්දී මට ලැජ්ජා හිතුණා.

💘💘සිහින මහත්තයට ඒක සිහිනයක්ම වෙයිද දන්නේ නැහැ...

මං ඇහක් ගහලා එහෙම කිව්වට අයියට ඒකට දුක හිතුණා.

💘💘ඇයි මහත්තයෝ මේ..
💘💘ඔය වගේ කතා කියනවද.. තව දවස් පහකින් ඔයා මගේ වයිෆ්..
💘💘අපෝ පුංචි විහිළුවක් කරේ මහත්තයෝ.. මහත්තයෝ මට අර ගවුම අරන් ඕනි.. අර ලා රෝස පාට එක..
💘💘ඒක මොකටද..
💘💘සාරියට වඩා මං මේකට ආසයි.. මහත්තයා අර නිල් පාට සූට් එක අඳින්න.. මහත්තයා ලස්සනට ඉඳී..
💘💘හරි එහෙනම් ඒ දෙක ගමුකෝ..

අයියා හිනාවෙවිම අරන් දුන්නා.

*****************************

දිනකට පසු..

💑👪පුංචි නෝනේ ඔය උණට කොත්තමල්ලියි පැනඩෝල් බීලා හරි යන්නේ නැහැ.. බෙහෙත් ටිකක් ගිහින් ගමු.. ඇඟට පණ නැහැ.. ඒ මදිවට නෝනා බත් කටක්වත් කන්නේ නැහැනේ..
💑👪අනේ ලතා අම්මා.. ඒ වුණට නෙමෙයි.. සතුටට.. තව දවස් තුනකින් මං සිහින අයියගේ.. එයා මගේ.. මේ රෝස පාට ගවුමේ ලස්සන බලන්න..

මං ලතා අම්මට ගවුම පෙන්වන ගමන් කිව්වා.

*****************************
විවාහයට දිනකට පෙර...

💘💘සුදූ.. වැඩ ගොඩයි කෙල්ලේ ගෙදර.. ඔක්කොම ලැස්ති නේද..
💘💘ඔව්.. අනේ මට උණ වගේ.. කන්න බැහැ.. අප්‍රියයි..
💘💘හී හී.. හිටුකෝ.. මං ඔය උණයි අප්‍රියාවයි ඉක්මණටම හොඳ කරන්න.. ආදරෙයි මගේ මැණිකට ගොඩක් උම්මාහ්..
💘💘මාත් ආදරෙයි මහත්තයෝ.. ඉක්මණටම මාව ඔයාගේ කරගන්නකෝ..
💘ඉවසපන්කෝ.. මේක පුදුම හදිස්සියක්නේ.. මගේ කෙල්ලව සතියකින් දැක්කෙත් නැහැ.. ඕවා කියලා මාව චූන් කරන්න එපා..
💘හී හී.. ආදරෙයි මහත්තයෝ..

********************************

විවාහයට පෙර දින..

💘සුදූ.. ඔන්න හෙට පාන්දර දෙකට මේකප් දාන්න කට්ටිය එයි.. මගේ මැණිකව එක්කන් එන්න මගේ තාත්තා එයි.. හෙට තමා ඒ දවස.. අපි දෙන්නගේ සතුටුම දවස..

💘ඔව්.. මහත්තයෝ.. ඒත් මට බයයි.. උණ වගේ...
💘හැම කෙල්ලටම ඔහොම තමා.. වෙඩින් එකට කලින්.. බයයි තමා.. මං ඉක්මණටම ඔය බය නතර කරන්නම්කෝ... උම්මාහ්..

*****************************

විවාහය දින...

💔අනේ මගේ රත්තරනේ.. මේ මොකද උනේ.. අද අපේ වෙඩින් එක.. නැගිටින්නකෝ.. මේ රෝස පාට ගවුමට ඔයා ලස්සනයි රත්තරන්.. මං මේ නිල් පාට සූට් එකත් ඇඳලා අාවා.. ඇස් අැරලා මං දිහා බලන්න මැණික..

සුදු ඇඳක් උඩ සුදු ඇතිරිල්ලකින් වහලා තියෙන රෝස පාට ගවුමකින් හැඩ වුණු මන්දාකිණිගේ නිසල සිරුර තුරුල් කරගෙන සිහින මුළු රෝහලම දෙවනත් වෙන්න ඇඩුවත් ආයිමත් මන්දාකිණි නැගිට්ටේ නැහැ.

💉 ඩොක්ටර් සිහින.. ඇයැම් වෙරි සොරි.. මන්දාකිණිට ඩෙංගු.. හොස්පිට්ල් එකට ගේද්දිත් පේලේට්ලට් කවුන්ට් එක හොඳටම අඩුයි.. පැනඩෝල් බිබීම ඉඳලා.. හොස්පිට්ල් එකට ගේද්දිත් මන්දාකිණි නැති වෙලා..

💔අනේ මගේ මැණික නැගිටලා කතා කරන්න.. එදා වෙඩින් සාරි ගන්න ගිහින් මගේ මැණිකට මාව හීනයක් වෙයි කියපු එක ඇත්තක් වුණානේ.. මේ පව්කාරයා තමා ඔයාව මරා ගත්තේ.. වලව්වේ ගස් වැවිලා මගේ මැණිකට කන්න බැහැ.. උණ.. ඇඟට අමාරුයි කියද්දීත් මේ පව්කාරයා ගනන් ගත්තේ නැහැ.. මගේ දොස්තර කමෙනුත් වැඩක් නැහැ.. මට මගේ මුළු ජීවිතේම නැති වුණා..

සිහින රෝහලේ බිත්තියකට හිස තුවාල වෙලා ලේ එනකන්ම ගහගෙන වියරුවෙන් වගේ කෑ ගැහුවේ හැමෝගෙම ඇස් වලට කඳුලක් එක් කරමින්..

💉 වරද කාගෙද...
සිහිනගෙද.. 🏃
මන්දාකිණිගෙද...🚶
විසකුරු ඩෙංගු වලද...

💧මේ වගේ අයලේ පරවුණු තුරුණු ජීවිත කීයක් නම් ඇත්ද...

😟ඔබගේ වටපිටාව පිරිසිදු කරගෙන ඔබත් අදම ඩෙංගු රකුසාට තිත තැබීමට සැරසෙන්න...

💔දුකක් දැනෙන්න ඒ දුක විඳින්නම ඕනි යනු කියමනක්ම නොවේ.. 😭😭😭😭

-----------------------------------

උන විකාරෙන් ලිව්වේ ලස්සන නැතිව ඇති යාළුවනේ... 😮😮😮




❤🖤□❤🖤□❤🖤□❤🖤□ කෙටි කතාවක්... ❤🖤□❤🖤□❤🖤□❤🖤□

**මම රනිතු සඳකැන්. අවුරුදු තුනකට පස්සේ ලංකාවට ආවේ. කෙටියෙන්ම කියනවනම් මං කෙල්ලන්ගේ නිරුවත තුළින් සතුට හොයපු මිනිහෙක්. ඒක මගේ විනෝදාංශයක් වගේ. ධනවත් පවුලක එකම දරුවා වුණ නිසාත් අම්මා නැති නිසත් මං ගැන හොයන්ව කෙනෙක් ඇත්තෙම නැහැ. තාත්තා බිස්නස්මයි. ක්ලබ් වලට හොටෙල් රූම් වලට කෙල්ලෝ එක්ක හිටපු මට කෙල්ලෝ නිකන් සෙල්ලම් බඩු. පයට පෑගෙන දූවිල්ලක් තරම්වත් වටින්නේ නැහැ.**

මට සල්ලි තියෙන නිසා මගේ සල්ලි වලට වහ වැටුණු පිටරට කෙල්ලොත් මාව අතාරින්නෙම නැහැ.

මතක් වෙද්දිත් මුවහට හිනාවක් ආවා. මේ පාර මං ලංකාවට ආවේ ආච්චි අම්මා බලන්න. අම්මා නැති වුණාට පස්සේ මං ගැන හොයලා බැලුවේ ආච්චි අම්මා. හැමදාම ලංකාවට ආවම මං කිරින්දට යන්නේ ආච්චි බලන්න.

කිරින්ද වෙනස් වෙලා තියෙන තරමක්. ඈත තියෙන මල් කඩේකට මගේ හිත ගියේ අවුරුදු තුනකට කලින් අතීතය මතක් කරමින්.

එදත් හරියටම මීට අවුරුදු තුනකට කලින් අද වගේම ලස්සන දවසක්. මං ඩ්‍රයිවර්ට කාර් එක නතර කරන්න කියලා කැමරාවත් අරගෙන පයින් ඇවිදගෙන ඉස්සරහට ආවේ ලස්සන පින්තූර ගන්න ගමන්.

💕❤මහත්තයා බලාගෙන...

මාව බිම ඇදගෙන වැටුණේ කවුරුහරි තල්ලු කරද්දී. මාව වැටිලා කකුල තුවාල වෙලා ලේ එන්න ගත්තා. ඒත් එක්කම මං හැරිලා බැලුවේ මගේ කකුල අල්ලන් ඉන්න ලස්සන තරුණිය දිහා. ඒත් මගේ ඇස් නතර වුණේ ඇගේ ගවුමෙන් එළියට පෙනෙන පිරුණු ලමැද දෙසට. මූණ දිහා බලන්නත් කලින් ඇයව මගේ කර ගන්නවා කියන කපටි සිතුවිල්ල මගේ ඔලුවට ආවා. නා දළු වන් තොල් පෙති. බිම ගෑවෙන වරලස. දිගු නිල් නෙතු යුවල යටපත් වෙලා තිබ්බ මගේ හැඟීම් තවත් අවධි කරා.

💕❤මහත්තයෝ අමාරුයිද...
💕❤ඔව්... ඉන්න බැහැ රිදෙනවා...
💕❤මහත්තයා මේ ළඟ පාතද...
💕❤නැහැ... මං මේ යාළුවෙක් හොයාගෙන යමින් ගමන්.. දැන් බස් එකෙන් බැස්සේ.. බැහැල බලද්දී පර්ස් එක කවුද උස්සලා.. එඩ්රස් එකත් නැති වෙලා.. යන්න තැනක් නැහැ.. ඒ මදිවට මේ කකුල රිදෙනවා..

මං ඇස් වලට කඳුළු පුරවන් දිවට නොදැනෙන් බොරුවක් කිව්වේ ඇගේ ලමැද දිහා බලාගෙනමයි. ගවුම ඉරලා රෙදි පටියක් ගැට ගහපු කෙල්ල මාව නැගිට්ටව ගත්තා.

💕❤මං සමනළී මහත්තයෝ.. මෙතන මල් කඩේ කරන්නේ.. මහත්තයා කකුල හොඳ වෙනකන් අපේ ගෙදර ඉන්න.. ආච්චි විතරයි මට හිටියේ.. ආච්චි ගිය මාසේ නැති වුණා..
💕❤අනේ ලොකු උදව්වක්...

මං කෙල්ලලේ ඉන තදින් අල්ලමින් නැඟිට්ටා. ඇඟට අමාරු නැති වුණත් බොරු ඇගේ අමාරුවක් අරන් මං ඇගේ සිරුරටම වත්තන් වුණේ ඒ ඇගේ රස්නේ මට දැනෙන විදියටම. ගෙදර කවුරුත් නැත්තම් මට තවත් ලේසි. මං එහෙම හිතුවා.

************
සතියකට පසු.

💕❤සමනළී මට කියන්න දෙයක් තියෙනවා...
💕❤කියන්න මහත්තයෝ...
💕❤මං සමනළීට ආදරෙයි.. අපි බඳිමු...

මං කෙල්ලගේ නළලත සිප ගෙන කියද්දී කෙල්ල හඬමින් මං දිහා බැලුවා.

💕🖤මහත්තයෝ.. මං අනාථ කෙල්ලෙක්.. මහත්තයට ගැලපෙන්නේ නැහැ...
💕🖤මං ආදරෙයි අපි බඳිමු.. මාත් පොඩි රස්සාවක් කරන්නේ.. බැඳලා කොළඹ යමු..

මං එහෙම කිව්වම කෙල්ල මාව මුළු ජීවිතේම කරගෙන තුරුල් කර ගත්තා.

***********

එදින සවස.

සතියකුත් ගියා මට මගේ වැඩේ කරගන්න බැරි වුණා කියලා මං හිත හිත ඉද්දිම කෙල්ල නාලා දිය රෙද්දකුත් ඇඳගෙන කොණ්ඩේ පිහිදාගෙන ගේ ඇතුළට එනවා. කෙල්ලගේ සිරුරේ කෝමළ රේඛාවන් මනාව කැපිලා පෙනෙද්දි මෙතෙක් වෙලා නිදාගෙන හිටපු රනිතු කියන සල්ලාලය අවධි වුණා. මං කෙල්ලව උස්සගෙන ඇඳට ගිහින් කෙල්ලගේ අකමැත්තෙන්ම ඒ ඇඩිල්ල මැද්දේ සමනළිගේ දෙතොල්, මුහුණ , බෙල්ල, ලමැද මුළු සිරුරම වියරුවෙන් වගේ සිප ගනිමින් සමනළිගේ ඇඩිල්ල නතර වෙනකන්ම මගේ සියළුම ආශාවන් සංසිඳවාගෙන ඇගේ නිරුවත් ලමැදටම තුරුල් වුණා.

💕🖤අඩන්න එපා සමනළි.. මේවා සමාන්‍යයෙන් කොල්ලෝ කෙල්ලෝ අතරේ වෙනවා.. අපි බඳිමු ඉක්මණටම..

මං දිවට නොදැනෙන විදියට බොරුවක් කියලා වේදනාවෙන් මිරිකි ඉන්න සමනළි ආයිමත් අඬද්දි ඇගේ ඇඟටම බර වුණා.

💕🖤මහත්තයා බැන්දට පස්සේ දෙන්න හිටිය මගේ පිවිතුරුකම මේ...

සමනළි අමාරුවෙන් දිය රෙද්ද ගත දවාටාගෙන නැඟිටින ගමන් සුදු ඇතිරිල්ල වූ රතු සලකුණ පෙන්නලා මගේ දෙපා ළඟ වැටුණා.

💕🖤මාව අනාථ කරන්න එපා මහත්තයෝ..

මගේ දෙපා සිපගනිමින් ඇඩුවත් මට ගාණක් වුණේ නැහැ. අවුරුදු ගාණක් පිටරට කෙල්ලෝ එක්ක හිටියත් සමනළිගේ ඇරෙන්න මං කිසිම කෙල්ලෙක්ගේ මේ පිවිතුරු සලකුණ දැකලා නැහැ.

************

මාසයකට පසු.

👌👌ඒ රනිතුවෝ මේ පාර කෙල්ලෝ කීයක් අමාරුවේ දැම්මද.. ඉක්මණටම වරෙන් හෙට උදේ ෆලයිට් එක...

මගේ හොඳම යාළුවා හිනා වෙවී කෝල් කරලා කිව්වේ ඌ මන් ගැන දන්න නිසා. මං ඇඳුම් ඇඳගෙන යන්න ලෑස්ති වෙද්දී සමනළි දුවගෙන ආවා.

💕🖤මහත්තයෝ.. සුබ ආරංචියක්.. මහත්තයා දැන් තාත්තා කෙනෙක්..

සමනළි මගේ කම්මුල් සිප ගනිමින් කියද්දී මං කෙල්ලව බිමට තල්ලු කරලා පර්ස් එකෙන් පන්දාහේ කොළ ටිකක් අරන් කෙල්ලගේ ඇඟට විසික් කරා.

💕🖤ආ... ඇබෝෂන් කර ගන්නවා..

මං එහෙම කියලා යද්දී කෙල්ල හඬා වැලපුනත් මං සමනළිව බිමට තල්ලු කරලා ආවා.

අම්මෝ හිත ගියපු දුර මල් කඩේ දැකලා. මේ මල් කඩේ කවුරුත් නැහැනේ. ඒ එක්කම මං දැක්කේ එහා පැත්තෙන් එන ලොරියක් මාව පණ නැති වෙලා යද්දී කවුද මාව ඇදලා ගත්තා.

💕🖤මහත්තයෝ බලාගෙන..

ඒ කටහඬමයි. ඒ රූපෙමයි. ඒ විදියටම අදත් මාව හැප්පෙන්න ගියා. සමනළි දෙවනි පාරටත් මගේ ජීවිතේ බේර ගත්තා.

💕🖤සමනළි ඔයා..

මං එහෙම කිව්වා විතරයි කෙල්ල කඳුලින් තෙත බරිතව හඬාගෙන ගියා. පිටිපස්සෙන් දුවලා වැඩක් නැහැ කියලා තේරුණ නිසා මං හොටෙල් එකට ආවා.

*************
එදින හවස.

සමනළිව මතකෙට එනවා. ඉන්න බැහැ. මං එයාට ආදරේ කරනවද. මේ රනිතු කෙල්ලෙක්ට ආදරෙයි. නැහැ වෙන්න බැහැ. ඒත් මං ඒ අහිංසක ඉකිබිඳින සමනළිට ආදරෙයි මගේ හිත කියන්න වුණා.

මං ඒ නිසා කාර් එකේ නැගලා මීට අවුරුදු තුනකට කලින් ගිය ගෙදරටම ගියා. ඉස්සර වගේ මල් වවලා නැති වුණත් ගේ ලස්සනයි. මං දොර ඇරන් ඇතුළට යද්දී පුංචි පුතෙක් මගේ පින්තූරයක් තියාගෙන සෙල්ලම් කරනවා. සෙල්ලම් බඩුවක් පැගිලා ආපු සද්දෙට පුතා මං දිහා හිනා වෙලා බැලුවා.

👨‍👩‍👦👨‍👩‍👦තාත්තා..

දෙවියනේ මගේ වගේ බළල් ඇස්. මගේ වගේම දකුණු ඇස යට උපන් ලපේ. මං එදා සමනළිගේ කරට දාපු මාලේ දාගෙන පුතා හිනාවෙවී දුවගෙන ඇවිත් මගේ දෙපා ළඟ වැටෙද්දීම මං පුතාව අල්ල ගත්තා. ඇඟ හිරි වැටිලා ගියා. පුතා මාව අතොරක් නැතිව සිප ගන්නවා. කිරි සුවඳ කට පුරාවට. "#මේ_මගේ_පුතා_මගේ_ලේ " මගේ හිත මට කියද්දි මගේ ඇගේ හිටපු කාමාතුර සල්ලාලයා මැරිලා ගිහින් පිය සෙනෙහස මුළු සිරුරෙම අකුණක් වගේ දිව ගියා. මං පුතාව ආදරෙන් සිප ගත්තා.

💕🖤මහත්තයෝ..

සමනළි දුවගෙන ඇවිත් මගේ අත හිටපු පුතාව උදුරාගෙන පිටිපස්සට ගියා.

💕🖤අනේ සමනළි මට සමාවෙන්න.. මගේ ළඟට එන්න.. මං ඔයාවයි පුතාවයි ඇස් දෙක වගේ බලා ගන්නම්..

මං බිම දණගහගෙන සමනළිගේ දෙපා ළඟ වැටුණා.

💕🖤ආදරෙන් මුලා කරලා මගේ පිවිතුරුකම උදුර ගත්තා.. මහත්තයා රුපියල් විසිදාහකට මගේ දරුවා මරන්න

**කිව්වා.. මං දරුවා මගේ දුර්වලකම නොකරගෙන මගේ ශක්තිය කරගෙන මල් විකුණලා මහත්තයගෙම නිර්නාමික පතිනිය වෙලා දරුවා බඩගින්නේ නොතියා හදා ගත්තා.. මගේ දරුවා අවජාතකයෙක් වුණාට කමක් නැහැ.. එයාට තාත්තෙක් එපා...**

**සමනළී අඬ අඬම පුතා වඩාගෙන ගේ පිටිපස්සෙන් මුහුද පැත්තට දුවගෙන ගියා.**

💕🖤**අනේ සමනළී.. මගේ පුතා...**

**මං බිම වැටිලා හොඳටම ඇඩුවා.**

****************

🖊️**පසුවදන....**


👉☞**රනිතු වගේ කාමතුර සල්ලාලයන්ගේ ගොදුරට ලක්වුණු දරුවෙක් සමඟ අතරමං වුණු ඉකිබිඳින සමනළීලා කීයක් ඇද්ද..**

👉☞**වැරද්ද කාගෙද.. දුර්වල ගෑණු හිතේද.. ආත්මාර්ථකාමී පිරිමි ශක්තියෙද... නැතිනම් රැල්ලට යන මේ සමාජයද...**

👉☞**මෙවන් වරදක් වූ විට කිරිකැටි සිඟිත්තා නොමරා ජීවත් කරන සමනළීලා කීයක් ඇද්ද..**

🔥💧🔥💧🔥💧**ඔබට සිතන්නට යමක්.....**

**උදාරි ප්‍රේමරත්න**


ප්‍රථම පෙම නුඹ තමයි
සැමදා...
උදාරි ප්‍රේමරත්න

💕🖤💕🖤💕🖤💕🖤 කෙටි කතාවක් 💕🖤💕🖤💕🖤💕🖤

සහස්‍රා උන්මාදනී වුණාට මගේ කිසිම ලස්සනක් නැහැ. කවුරුත් මාව දැක්කම දෙපාරක් නම් බලන්නේ නැහැ. මං කළුයි. කළු කියන්නේ කළුයි මං ගොඩක්. කොණ්ඩේ බොකුටුයි. උරහිස ගාවට පොඩි කොණ්ඩයක් තියෙන්නේ. ඒ වුණාට අම්මටයි තාත්තටයි මං උන්මාදනී. අම්මයි තාත්තයි මාළු දැල් ඇඳලා මාව ස්කෝලේ අරින්නේ. ශිෂ්‍යත්වේ හොඳට පාස් වෙලා කොළඹ ලොකු ස්කෝලෙකට ගියා. ඕ ලෙවල් වලින් ඒ නමයක් ගත්තේ කොළඹ දිස්ත්‍රික්කයේ තුන්වෙනියා වෙලා. ඒ සතුටට තාත්තා මට ෆෝන් එකක් අරන් දුන්නා. ස්කොලේ යාළුවෝ හැමෝම fb ඉන්න නිසා මාත් එකවුන්ට් එකක් හදා ගත්තා. මගේ හීන කුමාරයා තමා ජනූප අධිකාරි. අවුරුදු 22. ලංකාවේ හිට් වුණ හැම මියුසික් වීඩියෝ එකකම ඉන්නේ එයා. හරිම කඩවසම්. ඕනම තරුණියක් දහපාරක් වුණත් හැරිලා බලයි. මං එයාට fb රික්වෙස්ට් එකක් දැම්මා. දවස් තුනක් ගියත් ඇක්සෙප්ට් කරේ නැහැ. එක දවසක්

*************************

💘💘හායි නංගි.
💘💘හායි අයියේ.
💘💘ඉතින් ඔයා මොනා කරන කෙනෙක්ද.
💘💘මං ඒලෙවල් කරනවා. අයියා අද මොකද කරන්නේ.
💘💘මං අද අපේ තාත්තගේ අළුත් පිල්ම් එකේ ෂූට් එකට ලොකේෂන් බලන්න ගියා.

***************************

සති දෙකකට පසු.

💘💘කෝ මගේ කළු කෙල්ල.
💘💘ඇයි සුදු අයියේ.
💘💘ඔළුව රිදෙනවා හලෝ. හරි අමාරුයි. අම්මත් නැහැ. තාත්තා එක්ක නුවර ගිහින්. බලනවකෝ ළඟ හිටියා නම් ඔළුව අත ගා ගන්නවත් තිබ්බා.
💘💘ඉතින් මං අයියගේ ළඟ කියලා හිතන්න. අයියා දැන් පැනඩෝල් දෙකක් බීලා ඇඳට යන්නකෝ. ඔන්න මං ඔළුව අත ගානාවා. දැන් අයියට නින්ද යනවා.

එදින හවස..

💘💘කෝ මගේ කළු කෙල්ල. ආදරෙයි ගොඩක්. උම්මාහ්. දැන් ඔළුව රිදෙන්නේ නැහැ.
💘💘ඇත්තටම ආදරෙයිද මට.
💘💘නැතිව ඔයා මගේ කළු කෙලි පොඩ්ඩනේ.

****************************

මාස තුනකට පසු.

💘💘කළු. දැක්කද මගේ අළුත් පිල්ම් එක. හිට් නේද. කොල්ලා කොහොමද නිකන්. කෙල්ලොෆ් හොල්මන් වෙලා සයින් ගන්න දුවගෙන එනවා.
💘💘හී. මගේ සුදු අයියා කොහොමත් ලස්සනයි. දක්ෂයි. ඉතින් කෙල්ලෝ පස්සෙන් එනවා.

💘💘තැන්ක්ස් හලෝ. උම්මාහ්.

****************************

අයියා මට ඇත්තටම ආදරෙයිද. ඒ කියන්නේ මං කැත වුණත් දුප්පත් වුණත් අයියා මට ආදරෙයි. මාත් මගේ අයියට ගොඩක් ආදරෙයි. මං තව ටික කාලෙකින් අයියට මේ ගැන කියනවා.

*****************************

මාස හයකට පසු.

💘💘කළු කෙල්ලේ. මට දෙයක් කියන්න තියෙනවා.
💘💘මටත් කියන්න තියෙනවා. අයියා මුලින් කියන්නකෝ්.
💘💘මාව රයිගම් ටෙලි සම්මාන එකේ හොඳම නළුවට නොමිනේට් වෙලා. මට ඒ එවෝර්ඩ් හම්බවෙයිද කළු.
💘💘මගේ සුදු අයියා දක්ෂයි. ඔයා තමා ලංකාවේ දක්ෂම ලස්සනම නළුවා.
💘💘හී හී. මං දන්නවා. මොකද්ද ඔයාට කියන්න තියෙන්නේ.
💘💘මං මගේ සුදු අයියට ගොඩක් ආදරෙයි.
💘💘අම්මෝ. විහිළු කරන්න එපා හලෝ. හිනා වෙලා බඩ රිදෙනවා.
💘💘විහිළු නෙමෙයි. මං අයියට ඇත්තටම ගොඩක් ආදරෙයි. ( මං අඬ අඬම කිව්වා. )
💘💘මේ ඔය අදෝනාව නතර කර ගන්නවා. මනුස්සකමට මැසෙන්ජර් මැසේජ් දැම්මම හායි කිව්වා. මං හැම කෙල්ලටම ඔය විදියට මැසේජ් කරනවා. තමුසේ කොහොමද ඒක ආදරයක් කියලා හිතුවේ. අනික මං තමුසේ වගේ පට්ට කළු කැත දුප්පත් එකියක්ට ආදරේ කරයිද. තමුසෙව පාරෙවත් එක්ක යන්න පුළුවන්ද. මං කවුද කියලා අමතකද. මං ජනූප අධිකාරි. ෆිල්ම් ඩිරෙක්ට නිහාල් අධිකාරිගෙයි ලංකාවේ ගීත කෝකිලාවි චේතනා අධිකාරිගෙයි එකම පුතා. මං තමුසේ වගේ කැත කෙල්ලෙක්ට අහු වෙයිද. මෙච්චර මට පිස්සු වැටිච්ච ලංකාවේ නිළියෝ් ඉද්දී. වාතයක් නොවී මැරිලවත් යනවා. ආවා මෙතන ආදරේ කරන්න.

************************************

අවුරුදු දහතුනකට පසු.

"""""""" මෙන්න දැන් ලැබුණු විශේෂ පුවතක්. ලංකාවේ ජනප්‍රිය නළු ජනූප අධිකාරි මහතා අද දින චිත්‍රපටියක් රූ ගත කිරීමක් අතර තුර ඇති වූ ගින්නකින් පිළිස්සුම් තුවාල ලබා මේ වන විට කොළඹ ජාතික රෝහලේ දැඩි සත්කාර ඒකකයේ ප්‍රතිකාර ලබයි """""""

*******************************

💉💉අනේ ඩොක්ටර් ජනූපට කොහොමද.
💉💉මයි ගෝඩ් ඩොක්ටර් උන්මාදනී ඔයා. කවද්ද ඇමරිකා ඉඳන් ලංකාවට ආවේ. අපිට ආරංචියි ඔයාට සවුත් එෂියන් බෙස්ට් ඩෙමරටොලොජිස්ට් සර්ජන්ට් එවෝර්ඩ් එක ලැබුණා කියලා. අහන්නත් සතුටුයි. ඇත්තටම ඔයා ගොඩක් දක්ෂයි.
💉💉අනේ මගේ සුදු අයියා කොහොද.( මං අඬ අඬම ඇහුවා. ඒත් එක්කම මං ළඟට ජනූපගේ තාත්තා ඇවිත් මගේ අතින් අල්ලන් ඇඬුවා. )
👨‍👩‍👦👪අනේ පිං සිද්ද වෙයි ඩොක්ටර් මගේ පුතාගේ ජීවිතේ බේරලා දෙන්න.

💉💉තාත්තා බය වෙන්න එපා. ඒ මගේ පණ. මං අවුරුදු දහතුනක්ම එයා දිහා බලන් හිටියේ. මං එයාට කිසි දෙයක් වෙන්න දෙන්නේ නැහැ.

*********************************

මාසයකට පසු.

💘💘සුදු අයියේ. ඔයාට දැන් කොහොමද.
💘💘ඔයා. මට ඔයා එක්ක කතා කරන්න වෙලාවක් නැහැ. මගේ මූණ ගොඩක් රිදෙනවා. අම්මේ මගේ ෆැන්ස්ලට එන්න කියන්න. මාව බලන්න ගොඩක් කට්ටිය ඇවිත් ඇති.
👫👪අනේ මගේ රත්තරන් පුතේ. ඔයාව බලන්න ඇමරිකාවේ ඉඳන් දුවගෙන ආවේ මේ දරුවා විතරයි. මාසෙම ඔයා ගාව අඬ අඬ හිටියේ. මටත් වඩා ඔයා ගැන කලබල වුණා. පුතාගේ ප්ලාස්ටික් සර්ජරි එක කරන්නෙත් මේ දුව.
💘සුදු අයියේ. දැන් ටිකක් රෙස්ට් කරන්න. මං ඔයාගේ ඉස්සරහට එන්න නෙමෙයි හිටියේ. ඒත් මට එන්න වුණා. මට සමාවෙන්න.
💘මට මගේ මූණ බලන්න ඕනි.
💘අඬන්න එපා සුදු අයියේ. ඔයා කැත නැහැ. එදා වගේම ලස්සනයි මට. ඔයා බය වෙන්න එපා මං ඔයාගේ මූණ එදා වගේම ලස්සන හදලා දෙනවා. එතකොට ආයිමත් මගේ අයියගේ පස්සෙන් කෙල්ලෝ එයි.
💘අනේ මට සමාවෙන්න මගේ නංගී. මං ඔයා කැතයි කියලා ඔයාගේ ආදරේ හැල්ලු කරා. ඒකයි මට මෙහෙම වුණේ. ඒ්ත් අවුරුදු 13කට පස්සේ මං අච්චචර බැනලත් මාව බලන්න ආවේ ඔයා විතරයි. මට සමාවෙන්න. ඔයා තමා මගේ උන්මාදනී.
💘අඬන්න එපා අයියේ. ඔයා මං විරූපි කියලා මට බැනපු නිසා තමා මං අද ඩෙමරටොලොජිස්ට් කෙනෙක් වුණේ. මං කැත වුණාට අසරණ මිනිස්සු දහස් ගාණක් ලස්සන කරා. තමන් ආදරේ කරන කෙනා කැතයි කිව්වම දුප්පත් කියලා දාලා ගියාම හිතට හරි අමාරුයි. මං මගේ අයියට කලින් තිබ්බ ලස්සන මූණම අරන් දෙනවා. මං අයියාගේ උන්මාදනී නෙවෙයි. මොකද මං ලස්සන නැහැ. ඒත් මං අයියට ආදරේ කරා ගොඩක්. මං අයියාට කලින් තිබ්බ අයියගේ ලස්සන මූණ, ඒ ජනප්‍රියත්වය ආයිමත් අරන් දෙන්නම්. මං තාම ඉස්සර හිටපු කළු කෙල්ලමයි.
💘අනේ මගේ රත්තරනේ.

( ජනූපගේ කඳුළු රෝහලේ හිටපු හැමෝගෙම ඇස් වලට කඳුලක් ගෙනාවා. )

ඇත්තටම ආදරේ කරන්න හමේ පාට, ආර්ථික තත්වය, උගත්කම , රට , ජාතිය, ආගම ඕනිමද…

මේ ලොකේ ඒ වගේ දුක් විඳින නමට පමණක් උන්මාදනී වූ අසරණියන් කීයක් ඇත්ද…

- උදාරි ප්‍රේමරත්න -




#කෙටි_කතවක්

"#පුංචි_සමනළි_නෙත_ගැටුණා.

" පුතේ.. මොකද්ද මේකේ තේරුම.. ගිය එකී ගියා.. එහෙම කියලා උඹ බීලා මැරෙන්න හදනවද.. දැන් අවුරුදු තුනක් ගියා.. අමතක කරපන් පුතේ.. මේ දුප්පත් ගෑණි ලණු වක්කරලා උඹේ කරදඩු උස්මහත් කරේ.. උඹ දැන් ලොක්කෙක් තමා.. ඒත් මේ වයසක ගෑණි මැරෙන්න කලින් කැමති උඹේ දරුවෙක් බලලා ඇස් දෙක පියා ගන්න.. උඹ මේ කසාදෙටවත් කැමති වුණේ නැත්තම් අම්මපා මං නියගලා අලයක්වත් කාලා මැරෙනවා.. "

අම්මා වෙනදටත් වඩා හිතේ දුකෙන් අඬමින් අම්මගේ දුක්ගැනවිල්ල කියන්න ගද්දි කටගොන්නක් බීගෙන ආපු මගේ වෙරි හිඳුණා.

" හරි හරි.. මම එන්නම් හෙට මනමාලි බලන්න යන්න.. "

මම එහෙම කියලා කාමරේට ඇවිත් දොර වහ ගත්තා.

" බත් කන්නේ නැද්ද පුතේ.. "

අම්මා දෙ◌ාරට තට්ටු කරමින් ඇහුවා.

" බඩගිනි නැහැ.. "

මම එහෙම කියලා ඇඳට වැටුණා.

මම වනිඳු ලක්මාල්. ගොඩක් දුක් විඳලා හිතේ හයියෙන්ම ගොඩ ආපු කොල්ලෙක්. ඒත් ඒ හිතේ හයිය දුන්නේ මගේ රත්තරන් අම්මයි මාව දැන් විනාශ කරාට ඉස්සර මට ලොකු කෙනෙක් වෙන්න කිව්ව මගේ ආදරේ. සෙනුරි දිනූෂා.

මට මගේ අතීතේ මතක් වුණා.

වසර හයකට පෙර මම උසස් පෙළ සමත් වෙලත් රස්සාවක් නැති නිසා ජීවිතේ කළකිරිලා හිටියේ. අම්මා දහ දුක් විඳලා වෙලා නෙ◌ාකා නොබී ඉගෙන්නුවා. වාණිජ විෂය ධාරාවෙන් විභාගේ කරල සමත් වුණත් විශ්වවිද්‍යාලයට යන්න බැරි වුණා. වැඩි දුර ඉගෙන ගන්න සැප පහසුකම් තිබ්බෙත් නැහැ.

රස්සාවක් හොය හොය ඉද්දි හැමෝටම වගේ මටත් මගේ ආදරේ හම්බුණා. සෙනුරි ඇත්තටම අහිංසක තරුණියක්. මට වඩා ගොඩක් පැහැපත් අහිංසක කොණ්ඩේ ක්‍රේල් පුංචි කෙල්ලක්. මාස හයක් පස්සෙන් ගිහිල්ලා සෙනුරි එක්ක යාළු වෙලා ආදර සම්බන්ධතාවයක් පටන් ගත්තා. සෙනුරිත් මං වගේම දුප්පත්. කාත් කවුරුත් නැතිව අනාථ නිවාසෙක හැදුණු තරුණියක්. සෙනුරි ගාර්මන්ට් එකක වැඩ කරේ. එයා කොහොමහරි එයාට ඕන වියදම හොයා ගත්තා. ඒත් මට රස්සාවක් හරි ගියේම නැහැ.

" අයියේ.. මගේ යාළුවෙක්ගේ මහත්තයෙක් කොරියාවේ යනවා.. එහෙ පඩිත් හොඳයිලු.. ඔයත් බලන්නකෝ.. "

සෙනුරි වෙනදා වගේම එදත් හුරතල් වෙවී මගේ අතේ එල්ලිලා කිව්වේ රුපියල් දෙකේ වඩේ කන ගමන්.

" ඕවාට යන්න කලින් පාර්ස්පෝට් එවටත් සල්ලි එපැයි.. මට කොහෙද සල්ලි.. එදා ඔයා දීපු රුපියල් තුන්දාහෙන් තමා ගෙදර උයන පිහින බඩු ටිකක් ගත්තේ.. "

මම ඇස් වල කඳුළු පුරවගෙන ඇගේ පුංචි අත සිපගෙන කිව්වා.

" ඔයා මගේ මහත්තයා වෙන්නනේ ඉන්නේ.. මං ඉතුරු කරපු සල්ලි වගයක් තියෙනවා.. කසාදෙට කියලා එකතු කරේ.. මගේ අයියනේ මාව කසාද බඳින්නේ.. ඔයා ඒ සල්ලි වලින් කොරියාවේ යන්නකෝ.. ඔයා කවදාහරි ලංකාවෙට හොඳ තැනකට එනවා කියලා මම දන්නවා.. "

සෙනුරි හැමදාම වගේ ආදරෙන් කුලී වැඩ කරලා දාඩිය පිරුණු මගේ පපුව සිපගෙන කියද්දි මම ඇස් වල කඳුළු පුරවගෙන සෙනුරිව මගේ පපුවට තද කරලා තුරුල් කර ගත්තා.

සෙනුරිගේ ආදරෙයි මහන්සියි මගේ රත්තරන් අම්මගේ ආශිර්වාදයි නිසා මම කොරියාවේ ආවා. මම හොඳ මුදලක් එකතු කර ගත්තා. අම්මටයි සෙනුරිටයි වියදමට මුදල් එවලා ඉතුරු මුදල් ටික මගේ ගිණුමේ ඉතුරු කරා. අවුරුදු දෙකකට පස්සේ මං ලංකාවට ආවා.

අපි හිටියේ හොරණ. සෙනුරි හිටියේ බණ්ඩාරගම යාළුවෙක්ගේ ගෙදරක නැවතිලා. මම සෙනුරිටත් නොකියා ලංකාවට ආවා. අම්මව බලලා ඉවර වෙලා සෙනුරිව පුදුම කරවන්න කියලා සෙනුරිට නොකියම මම සෙනුරි නතර වෙලා ඉන්න ගෙදරට ගියා. මම යද්දී ඒ ගෙදර කවුරුත් නැහැ. ගෙදර පාළුවට ගිහින්. ගෙදර දොර ඇරලා දාලා. මම ගේ ඇතුළට යන්න හදද්දිම මට ඇහුණේ පුංචි දරුවෙක් අඬන සද්දෙ. කුස්සියේ ඉඳලා වීත්තෙකින් අත පිහිද පිහිද අඬ අඬ ආපු සෙනුරි කාමරේට දුවගෙන ගියා. මම පුදුමෙන් වගේ ඒ කාමරේ දොර රෙද්ද මෑත් කරලා බලද්දී දැකපු දේට මගේ මුළු ඇඟටම විදුලියක් කෙටුවා වගේ දැනුණා. මගේ පුංචි කෙල්ල සෙනුරි එයා ඇඳ සිටි ගවුමේ ඉස්සරහා බොත්තම් දෙකක් ගලවලා අර අඬන පුංචි දරුවව වඩාගෙන සෙනුරිත් අඬ අඬම ඒ කිරිකැටියව පපුවට තද කරගෙන එයාගේ පියයුරක් ඒ දරුවගේ මුවහට ලං කරා. දරුවා අඬන එක නතර කරලා සෙනුරිගේ ලමැදේ උණුසුමට නැලවුණා. සෙනුරි ඇස් වල කඳුළු පුරවගෙන දරුවගේ නළලත සිප ගත්තා.

මම අඬ අඬම කාමරේ ඇතුළට ආවා. මම සෙනුරිගේ අකමැත්තෙන් සෙනුරිගේ සුලැඟිල්ලක්වත් අල්ලලා නැහැ. තමන්ගේ දරුවෙක් පරිස්සම් කරනවා තරමට සෙනුරිව මම පරිස්සම් කරේ. මම පණ වගේ ආදරේ කරපු පුංචි කෙල්ල මම රට ගිහින් අවුරුදු දෙකකින් ලංකාවට එද්දී දරුවෙක්ගේ අම්මා කෙනෙක්. මම ඇස් දෙකටම දැක්කා එයාගේ ලමැදේ දරුවෙක් කිරි උරනවා.

" අයියේ.. "

සෙනුරි බය වෙලා මාව දැකලා දරුවා පපුවට තුරුල් කරගෙනම නැගිට්ටා.

" අයියේ.. මට ඔයාට ගොඩක් දේවල් කියන්න තියෙනවා.. "

සෙනුරි අඬමින් කිව්වා.

" මීට වඩා මොනා කියන්නද.. මම හැමදේම ඕනවටත් වඩා හොඳට දැක්කා.. මම දරුවා කාගෙද කියලා අහන්නේ නැහැ.. මොකද මම ඔයාගේ අතින් විතරයි ඇල්ලුවේ.. මං ආදරේ කරපු පුංචි අහිංසක කෙල්ල දැන් මහ ගෑණියෙක්.. දරුවෙක්ගේ අම්මෙක්.. මං යනවා.. ආ.. ඔයා මට රට යන්න දීපු සල්ලි..."

මම තාමත් ඇගේ කිරි උරලා නැලවුණු දරුවා දිහා බලමින් කියලා මගේ සාක්කුවෙන් මුදල් වගයක් අරගෙන ඇඳට විසික් කරා.

" අනේ මහත්තයෝ.. මාව දාලා යන්න එපා.. මං කියන දේ අහන්න.. මම මැරිලා යයි.."

සෙනුරි දරුවා වඩාගෙන මගේ දෙපා ළඟ වැඳ වැටුණත් මම සෙනුරි ගනන් නොගෙන ගෙදර ආවා. ගෙදර ඇවිත් පිස්සෙක් වගේ බිව්වා. ඒ මම සෙනුරිට දීපු ආදරේට සෙනුරි මට දුන්න දේට මටම රිද්ද ගන්න. අම්මා මම දුක් විඳිනවා බලාගෙන ඉන්න බැරිව අඩන නිසා මම ඉතුරු කර ගත්ත මුදල් වලින් මම මගේ ව්‍යාපාරයක් පටන් ගත්තා. මම නොහිතපු විදියට මම දියුණු වුණා.

හැබැයි මම සෙනුරිව බලන්න ගියේ නැහැ. ඒ සෙනුරි දැන් දරුවෙක් ඉන්න අම්මා කෙනෙක්. එයාට සැමියෙක් ඇති කියලා මම හිත හදාගෙන. ආදරේ කරපු හිතකින් වෛර කරන්න බැරි නිසා මම සෙනුරිට වෛර කරෙත් නැහැ. මම මගේම ගෙයක් හදගෙන අම්මා එක්ක කළුතරට ආවා. මට දැන් මුදල් වලින් අඩුවක් නැහැ. ඒත් මම තාම සෙනුරිගේ මතකයන් නිසා දුක් විඳිනවා. කොච්චර මුදල් තිබ්බත් මම හැමදාම රෑට ගෙදර එන්නේ බීගෙන. අදත් එහෙමයි. මම මේ සිද්දිය වෙලා අවුරුදු තුනක් ගිහිල්ලත් තාම සෙනුරි ගැන හිත හිත දුක් විඳිනවා. මම වෙනදා වගේම අදත් සෙනුරි ගැන හිතලා නිදා ගත්තා.

පහුවදා උදේ අම්මා බල කරන නිසාම අම්මා කතා කරපු ගාල්ලේ මනමාලි බලන්න ගියා. අම්මා කැමති නිසා මාත් ආයාසයෙන්ම හිනා වෙලා කතා කරා. ඒත් ඒ වෙලාවෙත් මගේ හිතේ හිටියේ සෙනුරි. මනමාලි බලලා ඉවර වෙලා මම අම්මා එක්ක එන්න හදද්දිම මම දැක්කේ එ් ගෙදර පිටිපස්සේ මිදුල අතුගාන තරුණියක්. දෙවියනේ ඒ සෙනුරිමයි. මම අම්මා මනාමාලිගේ ගෙදර අය එක්ක කතා කර කර ඉද්දි ඇස් වල කඳුළු පුරවගෙන සෙනුරි ළඟට දිව්වා. කොච්චර දේවල් වුණත් සෙනුරිව දැක්ම මගේ ඇස් වලට කඳුළු පිරිලා මගේ පරණ ආදරේ මතක් වුණා.

" සෙනුරි.. "

මම කෑ ගහද්දි සෙනුරි මාව දැකලා බය වෙලා මාව අඳුනගෙන ඉදල බිම දාලා පිටිපස්සේ ගේට්ටුවෙන් පැනලා දිව්වා. මම පස්සෙන් ගියත් සෙනුරි හොයා ගන්න බැරි වුණා.

ගෙදර ඇවිල්ලත් මගේ හිත තිබ්බේ සෙනුරි ළඟ. ඒ නිසා සෙනුරි හොයා ගන්නවා කියලා හිතාගෙන පහුවදා උදේ මම ආයිමත් ගාල්ලේ ගියා. ගිහින් එ් ළඟ ගෙවල් වලින් සෙනුරිගේ නම කියලා විස්තර ඇහුවා. මගේ පිනකටද මන්දා මම ගෙදර ලිපිනය හොයා ගත්තා. මම කාර් එක ගෙදරට තරමක් ඈතින් නතර කරා.

පුංචි පොඩි ගෙයක්.

" සෙනුරි.. "

මම දොරට තට්ටු කරලා කතා කරා.

" අනේ අන්කල්.. සෙනුරි නැහැ.."

පුංචි තුවායක් ඇඳගෙන ඒ තුවායෙන් මූණ විතරක් පේන විදියට මුළු ඇඟම වහගෙන පුංචි ගෑණු ළමයෙක් එළියට ආවා. මේ එදා සෙනුරිගේ අතේ හිටපු දරුවා වෙන්නැති. ඒත් මට ඒ දරුවව දැක්කම ආදරේ හිතුණා. මොනා වුණත් මේ සෙනුරිගේ දරුවා කියලා හිතලා මගේ ඇස් වලට කඳුළු පිරුණා. ඇත්තටම මේ දරුවා පුංචි රෝස මලක්. ඒ තරමටම ලස්සනයි. හුරතල්. දොරෙන් හිස එළියට දාලා පාර දිහා බලමින් මාත් එක්ක කතා කරා.

" අම්මා කොහෙද දූව ගියේ.. "

මම ගේ ඇතුළට ගිහින් පුටුවක වාඩි වෙලා ඇහුවා.

" මොන්ටිසූරියට හැමොේගෙම තාත්තා එනවා.. මගේ තාත්තා විතරක් නැහැ.. අම්මගෙන් තාත්තා ගැන ඇහුවම

අම්මා ඇඬුවා.. මටත් ඇඬුනා.. අම්මා මාව යාළු කර ගන්න කියලා මයිලෝ ගේන්න ගියා.. "

පුංචි දූව ඇස් වල කඳුළු පුරවගෙන කියද්දි මගේ ඇස් වලටත් කඳුළු පිරුණා.

" අද මම මොන්ටිසූරි යන්නේ නැහැ.. "

පුංචි දූව අත් දෙක ඉනට බැඳගෙන තරහෙන් කිව්වා.

" මගේ දූවගේ නම මොකද්ද.. "

මම ආදරෙන් ඇහුවා. මම නම ඇහුවා විතරයි දූව ගේ ඇතුළට ගිහින් සමනළයෝ දෙතුන් දෙනෙක් ඉන්න පුංචි ප්ලාස්ටික් බඳුනක් ගෙනවා.

" #සමනළිද..."

මම හිනා වෙලා ඇහුවා.

" සමනළි අහස්යා.. මම ආස නැහැ ඒ නමට.. "

දූව තරහෙන් කියද්දි මගේ හිතේ දරු සෙනෙහස පිරි ඉතිරෙන්න ගත්තා. මම අඬ අඬම දූවව තුරුල් කරගෙන ආදරෙන් සිප ගත්තා.

" මගේ දූවට මොනාද ඕනි.. "

මම පුංචි කොපුලක් සිපගෙන ඇහුවා.

" තාත්තෙක් ඕනි.. හැමෝටම ඉන්නවා.. මට විතරක් නැහැ.. යාළුවෝ විහිළු කරනවා.. මට විතරක් නැහැ කියලා.. මට මොන්ටිසූරි යන්න බැහැ.. අම්මට කියන්නකෝ මට මොන්ටිසූරි යන්න බැහැ කියලා..."

පුංචි දූව කට උල් කර කර අඬ අඬ කියද්දි මගේ පපුව රිදෙන්න අරගෙන මට ඇඬුනා.

" මම එන්නද දූවේ තාත්තා විදියට..."

මම අඬ අඬම ඇහුවා.

" හැමදාම දවල්ට එනවද.. "

දූව මගේ අතින් බැහැලා හිනා වෙවී ඇහුවා.

" හා.. "

මම කඳුළු පිහිදාගෙන කිව්වා.

" තාත්තේ.. අපිට පරක්කුයි අනේ.. ඇඳුම් අන්දන්න.. "

පුංචි දුව මට ඇඳුම ගෙනත් දීලා මගේ කම්මුල් සිප ගත්තා.

" සුදු මැණික.. අම්මා මයිලෝ දෙකක්ම ගෙනාවා.. අද මගේ රත්තරන් මොන්ටිසූරි යන්නම ඕනි.. "

සෙනුරි එහෙම කියාගෙන ගේ ඇතුළට ආවා. තුවායක් ඇඳගෙන මගේ අතේ හුරතල් වෙන දුව දැකලා සෙනුරි බයෙන් පස්සෙන් පස්සට ගියා.

" අම්මේ තාත්තෙක් හම්බුණා.. "

පුංචි දුව මගේ ගෙල වටා අත දාගෙන මගේ කම්මුල් සිපගෙන කියද්දි සෙනුරි අඬාගෙන බිම වාඩි වුණා.

" සෙනුරි.. මං මොකුත් අහන්නේ නැහැ.. මම ඔය දෙන්නව බාර ගන්නවා.. කසාද බඳිමු.. යමු.. "

මම දුවව වඩාගෙන බිම වාඩි වෙලා ඉන්න සෙනුරිගේ හිස පිරිමදිමින් කිව්වා.

" අනේ මගේ මහත්තයෝ.. මම තාමත් මහත්තයගේ නොඉඳුල් කෙල්ල සෙනුරිමයි.. ඇයි මට කතා කරන්න නොදී මාව දාලා ගියේ .. "

සෙනුරි මගේ දෙපා අල්ලගෙන අඬන්න ගත්තා. ඒ වචන ටිකකට මාව ගැස්සිලා ගියා. දුව බය වෙලා මගේ මූණ දිහා බැලුවා.

" මගේ දුව ඇඟ සේදුවද.. "

මම හිනා වෙලා ඇහුවා.

" අම්මා උණු වතුර දාලා දුන්නා.. එ්ත් මම හේදුවේ නැහැ තාත්තේ.. හේදුවා නම් මොන්ටිසූරි යන්න වෙනවනේ.. "

දුව හුරතල් වෙවී කිව්වා.

" තාත්තා එන්නම් අම්මා එක්ක.. මගේ දුව යන්නකෝ.. "

මම දුවව බිමින් තියලා කිව්වා.

" #දාලා_යන්න_එපා_තාත්තේ.."

පුංචි දුව එහෙම කියලා ගේ ඇතුළට දුවගෙන යද්දී මගේ පපුව පිච්චිලා ගියා.

" සෙනුරි මොකද වුණේ.. "

මම බිම වාඩි වෙලා තාමත් අඬන සෙනුරිව උරහිසින් අල්ලලා නැඟිට්ටවලා ඇහුවා.

" මහත්තයෝ... මං.. "

" කියන්න..."

මම සෙනුරිව පපුවට තුරුල් කරගෙන ඇහුවා.

" මම හිටියේ සඳුනිගේ ගෙදරනේ.. සඳුනියි නිසල් අපේ අනාථ නිවාසෙමයි හිටියේ.. ඒ දෙන්නට කවුරුත් නැහැ.. අපි තුන්දෙනා පුංචි කාලේ ඉඳන්ම යාළුවෝ.. මහත්තයා රට ගියාම ඒ දෙන්නා කසාද බැන්දා.. සඳුනිගේ දුව තමා සමනළී.. එක දවසක් නිසල් වැඩ කරන තැන සර් කෙනෙක් නැති වෙලා ඒ දෙන්නා මළගෙදරක ගියා බයිසිකලේ.. දුවට එතකොට මාස හයයි.. මම ගෙදර නිසා ඒ දෙන්නට මම දුවව තියලා යන්න කිව්වා.. මල ගෙදර ගිහින් එද්දී බයිසිකලේ ටිපර් එකකට යට වෙලා දෙන්නම එතන මැරුණා මහත්තයෝ.. ඒ දෙන්නට කවුරුත් නැහැ.. ඉතින් මම මහත්තයා ආවම හැමදේම කියන්නම් කියලා දරුවා බලා ගත්තා.. ඒ දෙන්නා නැති වෙලා මාසෙකට පස්සේ මහත්තයා ආවේ එදා.. මාස හයේ කිරි බොන දරුවා පිටි කිරි බොන්නේ නැහැ.. බොහෙ◌ාම අමාරුවෙන් පොවා ගත්තේ ටිකක්.. දුව අඩද්දි මම හැමදාම නළව ගත්තේ මගේ කිරි නැති පියයුරක් උරන්න දීලා මහත්තයෝ.. එදා මගේ මහත්තයා ඒක දැක්කේ.. මම වරදක් කරේ නැහැ..."

සෙනුරි අඩ අඩ මගේ පපුවට තුරුල් වෙලා කියද්දි මගේ ඇස් වලින් කඳුළු වැක්කෙරෙන්න ගත්තා.

" අනේ මං වගේ පව්කාරයෙක්..."

මම අඩ අඩම කිව්වා.

" මම මහත්තයා එනකන් හැමදාම බලාගෙන හිටියා.. එ්ත් මහත්තයා මං වැඩ කරන ගෙදර පුංචි නෝනව බලන්න ආවම මං බාගෙට මැරුණා මහත්තයෝ.. මං මහත්තයව හොයාගෙන හොරණත් ගියා.. මහත්තයා හිටියේ නැහැ.. "

සෙනුරි අඩ අඩ කියද්දි මට මං ගැනම කලකිරිමක් ඇති වුණා. මං එදා ඇහට දැක්ක දේ විශ්වාස කරා ඇරෙන්න සෙනුරිට වචනයක් කතා කරන්න දුන්නේ නැහැ. මම පරණ ගෙදරින් ඇවිත් කළුතර අළුත් ගෙයක් ගත්තා. මම සෙනුරි ගැන හිතින් හැමදාම දුක් වින්දා මිසක් කවදාවත් සෙනුරි ගැන හෙව්වේ නැහැ. මම සෙනුරිව පපුවට තුරුල් කරගෙන හොඳටම ඇඬුවා.

" මේ පව්කාරයට සමාවෙන්න සෙනුරි.. ඔය දෙන්නා යමු මාත් එක්ක.. අපි අදම කසාද බඳිමු.. සමනළී අද ඉඳන් මගේ දුව.. "

මම සෙනුරිගේ කඳුළු පිහිදාමින් කිව්වා.

" මම ආදරෙයි මහත්තයෝ.. මට සමාවෙන්න.."

" මටත් සමාවෙන්න සෙනුරි... අවුරුදු තුනක් ආදරේ කරලත් මම දැක්ක දේ විශ්වාස කරා ඇරෙන්න ඔයාට ඇහුම්කන් දුන්නේ නැහැ.. එදා මම විනාඩි පහක් ඔයා එක්ක කතා කරා නම් අද අපි දෙන්නා මේ විදියට දෙපැත්තට වෙලා දුක් විඳින්නේ නැහැ.. මගේ වැරැද්ද..#මම_කොච්චර_ඔයාට_ආදරේ_කරත්_දැකපු_දේ_විශ්වාස_කරා_ඇරෙන්න_ඔයාට_ඇහුම්කන්_දුන්නේ_නැහැ.. "

මම අඩ අඩම කිව්වා.

" තාත්තේ හරි.. "

පුංචි දුව කෑ ගහද්දි මම හැරිලා බැලුවා.

"#පුංචි_සමනළියක්_නෙත_ගැටුණා.. "

මම හිතින් හිතලා තුවායක් ඇඳගෙන ඉන්න පුංචි දුවව වඩා ගත්තා.

" මගේ තාත්තා.. "

දුව මාව තුරුල් කර ගද්දි සෙනුරිත් මගේ පපුවට තුරුල් වුණා.

" ඔව් දුව මම ඔයාගේ තාත්තා.."

මම පුංචි සමනළීගේ කම්මුල් සිපගෙන කිව්වා.

👩😇 සමාප්තයි 👩😇

🔥💧 සිතන්නට යමක්...

👉☞ ආදරේදී එකිනෙකාට ඇහුම්කන් දීම වඩා වැදගත්ද....

👉☞ ආදරේදී ඔබ ඇස් දෙකට දකින දේටත් වඩා සත්‍යය එහෙත් ඔබ විශ්වාස කිරීමට අකමැති දේවල් තිබිය හැකිද..

👉☞ මෙවැනි අතපසුවීම් නිසා තවමත් දෙපැත්තට වී දුක්විදින වනිදුලා , සෙනුරිලා අද සමාජයේ සිටිය හැකිද...

👉☞ දෙමාපියන් නැතිව අසරණ වී දුක් විඳින පුංචි සමනළිලාට පිය සෙනෙහස ලැබේද...

දුටුවදා ඒ පුංචි නෙතු අඟ
කඳුළු බිඳු මා හැඬෙව්වා
සමනළි ඈ මගේ සිත් ගත්
ඈගේ පියණාන් සොයනා

කිරි සුවඳ මුව පුරා තවරා
තාත්තේ යැයි ඇය කියා
තුරුළු කර ඇය හාදු දීලා
මම ඇයට යළි ලං වුණා

වැදූ නැති මුත් ආදරෙයි මං
මගෙයි නුඹ මගේ සමනළි
වෙමි පියාණන් හැම භවේදි
පතමි සියවර නුඹ සාදා...

උදාරි ප්‍රේමරත්න

**ඔයාලගේ අදහස් කියන්න යාළුවනේ..** 😊☺😊☺😊☺

**ඇල්බම් එකට** 👇👇

https://www.facebook.com/udaaaprem/




#සුභ_උපන්දිනයක්_වේවා_මගේ_තාත්තේ...

#තාත්තා_ඇතුළු_වීරෝධාර_රණවිරුවන්ට_මෙය_උපහාරයක්ම_වේවා....

#කෙටි_කතාවක්

#අතීතයේ_දවසක

" අම්මේ.. මං කිව්වනේ.. මම අද ඉස්කෝලේ යන්නේ නැහැ..."

මම කිරි තේ එකක් හදාගෙන ඇඳේ තාමත් නිදාගෙන ඉන්න මගේ දස හැවිරිදි පුතාට පාසල් යන්න කතා කරා. හැමදාම වගේ පුංචි පුතා අදත් නැගිට්ටේ මාත් එක්ක කේන්තියෙන්. මගේ ඇස් වලට පිරුණු කඳුළු මං හන්හගෙන පුතුට හොරෙන් පිහිදා ගත්තා.

" ඉස්කෝලේ යන්නේ නැතුව කොහොමද පුතේ මගේ පුතා තාත්තා වගේ ලොකු මහත්තයෙක් වෙන්නේ.. "

මම ඇඳ මත වාඩි වෙලා පුතුගේ හිස ආදරයෙන් පිරිමැද්දා.

" මට බැහැ.. ළමයි අහනවා මට තාත්තෙක් නැද්ද කියලා.. මට විහිළු කරනවා.. ඇයි තාත්තා ගෙදර එන්නේ නැත්තේ.. මගේ පංතියේ ළමයි කවුරුත් තාත්තව තාම දැකලා නැහැ.. මම ශිෂ්‍යත්වේ කරන්නත් නැහැ.. මට අම්මත් එපා.. "

පුංචි පුතා අඬමින් කියලා ඇඳගෙන සිටි පුංචි කොට කලිසම පිටින්ම මහත්තයා කලින් හදලා දීපු සරුංගලය අරගෙන ගේ පිටිපස්සේ දොරෙන් අඬාගෙන දිව්වා.

පුතා අඬද්දි මගේ හිතට හරි අමාරුයි. ඒත් මං මොනා කරන්නද දෙවියනේ. මගේ මහත්තයා කරන්නේ#රාජකාරියක්_නෙමෙයි_දේවකාරියක්. මම ඇස් වල කඳුළු පුරවගෙන පුතා අඬමින් දුවගෙන යන හැටි බලමින් උළුඅස්සට හේත්තු වුණා. #පුතු_මගේ_හඬයි_ඔබ_එනතුරු_පෙර_මහට_වෙලා_මගේ_මහත්තයෝ. මම හිතින් හිතුවා.

" දුවේ.. ඔය පොඩි එකා පුතා වගේම මුරණ්ඩුයි.. මම යන්න එපා කියද්දිමනේ ඔය හමුදාවට ගියේ.. තාත්තත් ගියා කියලා.. කෝකටත් ලියමනක් ලියලා බලපන් මගේ දුවේ.. නැත්තම් ඔය පොඩි එකා සිස්සත්තෙට අරිනවා බොරු.. "

මහත්තයගේ වියපත් මව පමණයි මට ඉතුරු වුණේ. අම්මා අමාරුවෙන් හැරමිටියට වාරු වෙලා මගේ ළඟට ඇවිත් කියද්දි මෙච්චර වෙලා හන්හගෙන හිටපු කඳුළු කැට එළියට පැන්නා.

" හරි අම්මේ.. මම ලියමනක් ලියන්නම්.. "

මම එහෙම කියලා පුතාගේ පුංචි පොත් මේසේ ළඟට ඇවිත් වාඩි වුණා.

" පුතා චිත්‍ර අඳින්න හරිම දක්ෂයි.. ඒ මදිවට මේ පාර පන්තියේ පළවෙනියා.. හමුදාවේ ඉන්න මගේ මහත්තයට#දහසකුත්_රාජකාරි තියනවා කියලා මම දන්නවා.. ඒත් මගේ දරුවට #පිය_සෙනහස ලැබෙනවා මදී නේද.. "

මගේ හිත මගෙන්ම අහද්දි මම අඩ අඩම කඩදාසියක් අරගෙන පෑනක් අතට අරගෙන ලියමනක් ලියන්න පටන් ගත්තා.

" මහත්තයෝ.. ඉවසලා බැරිම තැනමයි මං මේ ලියමන ලියන්නේ.. මං දන්නවා මහත්තයාට වැඩ රාජකාරි වැඩියි කියලා. ඒත් #මහත්තයෝ_පුංචි_පුතා_හැමදාම_තාත්තව_ඉල්ලලා_අඬනවා... රේඩියෝවේ කිව්වා මේ දවස් වල #කලබල_වැඩියි කියලා.. #මට_බයයි_මහත්තයෝ.. අම්මටයි , මටයි , පුතාටයි ඉන්නේ මහත්තයා විතරයි.#අපි_දැනටමත්_මහත්තයා_ඈතක_නිසා_තනි_වෙලා_ඉන්නේ.. අපේ පුතා මහත්තයා ආවේ නැත්තම් ශිෂ්‍යත්වයට යන්න බැහැ කියලා අඬනවා.. පුතා ඉගෙන ගන්න ගොඩක් දක්ෂයි මහත්තයෝ.. ලොකු මහත්වරු කාට හරි කියලා දවස් දෙක තුනකට හරි ගෙදර එන්න මහත්තයෝ.. #මට_පුතා_අහන_දේවල්_වලට_උත්තර_නැහැ.. මගේ මහත්තයා #පරිස්සමින් ඉක්මණටම ගෙදර එනවා නේද.. #අපි_බලාගෙන_ඉන්නවා_මහත්තයෝ...#බුදුසරණයි... "

මම අඬ අඬම ලියන ලියද්දී මගේ ඇස් වලින් වැටුණු#කඳුළු_ලියමන_තවත්_දුක්බර කරා. මම ලියමන තැපැල් කරලා ගෙදර ආවා.

*****

මාසයකට පසු...

" අම්මේ... ශිෂ්‍යත්වෙට කලින් ඉස්කෝලේ උත්සවයක් තියෙනවා.. මම විවිධ ඇඳුම් තරඟෙට ඉන්නවා..#යාළුවෝ_තාත්තා_කෝ_අහලා_විහිළු_කරාට_මම_දැන්_ගණන්_ගන්නේ_නැහැ_අම්මේ.. මම දැක්කා නැන්දලගේ ගෙදර ටීවී එකේ#තාත්තා_වගේ_ඇඳුම්_ඇඳ_ගත්තා_මාමාලා_යුද්ධෙ_කරනවා.. තාත්තත් ඒ වගේ ඇති නේද අම්මේ.. මම ඒකට ඇඳුම් තරඟෙට තාත්තා විදියට අඳිනවා.. "

හැමදාම වගේ පුරුද්දට අදත් හුල්ලමින් කුස්සියට වෙලා සම්බෝලයක් අන අන හිටපු මට පුංචි පුතා ඇවිත් එහෙම කියද්දි මට ඇඬිල්ල නතර කර ගන්න බැරි වුණා.

" අම්මා අඬන්න එපා.. මම ශිෂ්‍යත්වේ ලියන්නම්.. "

පුංචි පුතු මාව තුරුල් කරගෙන කිව්වා. මහත්තයට ඇරපු ලියමනට පිළිතුරක් තාම නැහැ. අනේ මගේ#මහත්තයට_කරදරයක්_වෙන්න_එපා_බුදුහාමුදුරුවනේ. මම පුංචි පුතුව තුරුල් කරගෙන පපුව පැලෙන්න තරම් වේදනා ගෙන දෙද්දි හිතින් හිතුවා.

****

සතියකට පසු..

"අප පාසලේ 5 වන ශ්‍රේණියේ ළමුන් අතර පැවති විවිධ ඇඳුම් තරඟයෙන් ජයග්‍රහණය කරනු ලබන්නේ#තම_පියා_මෙන්_ගුවන්_හමුදා_නිල_ඇඳුමෙන්_සැරසුණු 5 - A පන්තියේ ඉරේෂ් ආලොක සමරසිංහ පුතණුවන්ය..."

විදුහල්පතිනිය නිවේදනය කරලා කියද්දි මම සතුට වැඩි කමටම අඬ අඬ පුටුවෙන් නැඟිටලා අත්පොලසන් දෙන්න ගත්තේ මගේ රත්තරන් මහත්තයව මතක් කරගෙනමයි. පුංචි පුතු පදක්කම අරගෙන මගේ ළඟට දුවගෙන ඇවිත් මාව තුරුල් කර ගනිද්දි මගේ ඇස් වලින් කඳුළු වැක්කෙරෙන්න ගත්තා. මම අඬ අඬම පුතුව තුරුල් කර ගත්තා.

" ආලෝක.. ඔයාලගේ තාත්තත් යුද්ධෙට ගියාද.. ඔයාලගේ තාත්තා නියමයිනේ හලෝ.. අපේ ආච්චි කියන්නේ#හමුදාවේ_ඉන්නේ_සිංහයෝ කියලා.. අර

අපේ#ජාතික_කොඩියේ_ඉන්නවා_වගේ_කඩුව_අතින්_අර_ගත්ත_සිංහයෙක්..#ඔයාල‌ගේ_තාත්තත්_සිංහයෙක්ද ආලෝක.. "

පුතාගෙන් මෙච්චර දවසක් තාත්තා කෝ කෝ කියලා අහපු පුතාගේ යාළුවෝ පුතා ඇඳ සිටි නිල ඇඳුමේ පදක්කම් පිරිමදිමින් අහද්දි පුතා හිනාවෙවී මං දිහා බැලුවා.

" #දැන්_යාළුවෝ_විහිළු_කරන්නේ_නැහැ_අම්මේ_තාත්තා_සිංහයෙක්ලු.. "

පුතා මට හිනා වෙවී කියද්දි මම අඬ අඬම පුතාව තුරුල් කර ගත්තා.

" අනේ මගේ රත්තරනේ.. "

මම පුතාව තුරුල් කරගෙන කිව්වා.

පාසල් ඇරිලා ඇවිත් මම ගෙමිදුලේ හිනා වෙවී සෙල්ලම් කරමින් ඇතට දුවන පුතු දිහා බලාගෙන හිටියා. ඒත් එක්කම හමුදාවේ වාහනයක් ඇවිත් අපේ පුංචි පැළ ඉස්සරහින් නතර කරා. මම බය වෙලා ඇඳ සිටි චීත්තේ හදාගෙන මිදුලට දිව්වා.

" දෙවියනේ.. විශ්වාස කරන්න පුළුවන්ද..#සිංහයෙක්_වගේ_එඩිතරව_ගෙදරින්_ගියපු_මගේ_මහත්තයා_දෙපාවක්_සහ_අතක්_අහිමිව_රෝද_පුටු වකට_වැටිලා..#ඒත්_ඒ_මූණේ_හිනාව_එඩිතරකම_තේජස්_සිංහයෙක්_වගේමයි.. "

මම අඬ අඬම හිතුවා.

" මිස්.. මුලතිව් වලදි සර්ට වෙඩි වැදුණා.. මාසයක් ඉස්පිරිතාලේ හිටියේ.. අපි අද ගෙදර ගෙනවා.. "

නිලධාරියෙක් එහෙම කියලා මහත්තයව ජීප් එකෙන් බස්සද්දී මම අඬ අඬම මහත්තයට තුරුල් වුණා.

" අනේ මහත්තයෝ.. ඇයි මේ.. "

මම අඬමින් කිව්වා.

" #අඬන්නේ_ඇයි_සයුරි_ඔන්න_පුතාගේ_ශිෂ්‍යත්වෙට#කලින්_මම_ගෙදර_අ‍ාවා_ආබාධිත_වුණත්_මම_පණපිටි න්.. "

මහත්තයා හිනා වෙලා කියද්දි මම මගේ ඇස් වල කඳුළු පිහිදාගෙන මහත්තයා ළඟ දණ ගහ ගත්තා. අම්මත් අඬාගෙන ඇවිත් මහත්තයා තුරුල් කර ගත්තා. ඒත් එක්කම මිදුලට දුවගෙන ආවේ මගේ පුතා.

"තාත්තේ.. "

පුතා මහත්තයා දිහා බලමින් අඬමින් මහත්තයා ළඟට දුවගෙන ආවා.

" මගේ තාත්තට මෙහෙම කරේ කවුද... "

පුතා කෑ ගහලා මුළු ගමම දෙවනත් වෙන්න

අඩද්දී#වේදනාවට_නොඇඬු_මහත්තයා_පුතාගේ_කඳුළු_වලට_හයියෙන්_ඇඬුවා.

ඒ #පිය_සෙනහසද..

ඒ #රට_රැකි_අබාධිත_රණවිරුකෙුගේ_දුක්ගැනවිල්ලක්ද...

#වර්තමානයේ...

තිස් වසරකට පෙර ඇතිවුණු සටන එදා
කෙළවර වෙලා අද එය මතකයක් සදා
වනසා දමා කොටි බලතල ජවය යොදා
යළි එක් කරේ මේ රට වෙර විරිය හදා

ජීවිත ලක්ෂ ගණනක් බිලි අරන් මරා
ප්‍රභා ගියේ දුක් විඳලා රුහිරු පෙරා
රණවිරු දිලේවා සැමදා භවය පුරා
සිංහල මගේ රට බබළනු සසර සරා

රණවිරු නොවේ ඒ රට රැකි දෙවිවරුය
ණය නම් ගෙවිය නොහැකිය අප පරගැතිය
රැක ගත යුත්තේ ආබාධිත විරු කැලය
පැසසුම් නොවේ අද ඇත්තේ නින්දාය

දෙඇස් ඇරේවා බල කරනා පාලනයේ
විඳි දුක් කඳට සලකනු මැන මේ භවයේ
ඉවරයි සටන දැන් නොකියා විස්තරයේ
රැකපන් ඒ තමා ලක් මැණිගේ සිංහ ලෙයේ

🔥🌢 සිතන්නට යමක්... 👇👇

👉☞ #රට_රැකි_විරෝධාර_රණවිරුවන්ට_වර්තමානයේ_ලැබෙන_සැලකිල්ල_ප්‍රමාණවත්ද...

👉☞ ආලොේකගේ පියා මෙන් #අබාධිත_රණවිරුවන් කොපමණ ඇද්ද...

👉☞ නිසි වයසේදී #පිය_සෙනෙහේ_නොලාබුණු දූ දරුවන් කොපමණ සිටින්නට ඇත්ද...

👉☞ සයුරි මෙන් #කඳුළු_සලනා_බිරින්දෑවරු කොපමණ සිටින්නට ඇත්ද..

👉☞ අබාධිත රණවිරුවන් සමඟ අතරමං වුණු #තවමත්_කඳුළු_සලනා_බිරින්දෑවරු සිටීද..

🔥
🌢 #වසර_විසිහතක_සේවා_කාලයක_නිරත_වීම_නිස_පියාගේ_සෙනෙහස_නිසි_පරිදි_විඳින්නට_නොහැකි_වුණු_මමද_විරෝධාර_රණවිරවෙකුගේ_දියණියකි...

🔥🌢 #යුද්ධය_ඉවර_වූවාට_පසු_නිවසට_පැමිණි_මාගේ_පියා_මෙන්_තවත්_පියවරුන්_කොපමණ_ඇත්ද...

#යුද්ධය_යනු_බියකරු_වදනකි.

#ඊලාම_යනු_කුරිරු_සිහිනයකි.

#දිනූ_නිදහස_අද_සිහිවටනයකි.

🔥🌢 පසුවදන...

ලොව ප්‍රබලතම ගරිල්ලා සංවිධානය වන එල් ටී ටී ඊ සංවිධානය සහමුලින්ම විනාශ කරමින් 2009 මැයි මස 18 වන දින ශ්‍රී ලංකාව නැවතත් දෙවනි වරට එක්සත් කිරීමට දායක වුණු ත්‍රිවිධ හමුදාවේ , පොලීසියේ හා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ රට රකින ලද සියළු විරෝදාර රණවිරුවන්ට මෙය උපහාරයක්ම වේවා...

#මාගේ_පියාණන්_ඇතුළු_විරෝධාර_රණවිරුවන්ට_උපාහරයක් ලෙස මාගේ පන්හිඳෙන් රචනා කරන ලද්දකි..

සුභම සුභ උපන්දිනයක් වේවා මගේ තාත්තේ... 💗🖤💗🖤💗🖤

උදාරි ප්‍රේමරත්න... 👩‍🎓😇

👉☞ වෙනත් කෙටි කතා....

💗🖤ප්‍රථම පෙම නුඹ තමයි සැමදා...

https://m.facebook.com/story.php?story_fbid=298346483971975&id=100013898779829

💗🖤 නුඹ මගේ ලේ මගේ පුතුනි...

https://m.facebook.com/story.php?story_fbid=298929357247021&id=100013898779829

💗🖤 රකුසෙකුය බියකරු ඔබයි ඇයගේ මිනිමැරු...

https://m.facebook.com/story.php?story_fbid=300495827090374&id=100013898779829

💗🖤 ලේ කිරි සුවඳ නැති දා මං වඳ වූවා...

https://m.facebook.com/story.php?story_fbid=301173493689274&id=100013898779829

💗🖤 පුංචි සමනළී නෙත ගැටුණා...

https://m.facebook.com/story.php?story_fbid=316634235476533&id=100013898779829